**ජාත්‍යන්තර පාසල් පුස්තකාලයාධිපතීන්ගේ සංගමය** International Association of School Librarianship (IASL) **මඟින් ප්‍රකාශයට පත් කරන ලද වෘත්තීය පුවත්පතක්** (Professional Journal) **වන** 'School Libraries Worldwide' **හි පල කරන ලද ලිපියක් පරිවර්තනය කිරීම.**


**පාසල් පුස්තකාල කමිටු** 2018/2019, **ශ්‍රී ලංකා පුස්තකාල සංගමය**

**කැඳවුම්කරු : ඩී. ආර්. චන්දිමා දිසානායක මිය**

email : chandimadiss5@gmail.com

**උපදේශන සභාය : උපාලි අමරසිරි මයා**




**<u>Title</u>**

**From Teacher to School Librarian, Leader and Instructional partner: A Proposed Transformation Framework for Education of preservice School Librarians'**. By Sheila Baker. In School Libraries Worldwide, Vol. 22, No. 1, January 2016, pp 143-160

සිංහල පරිවර්තනය - Sinhalese Translation

උදිත අලහකෝන් [B.A. (Hons), MLS] විසින් සිංහලට පරිවර්තනය කරන ලදී.

## ගුරුවරයාගේ සිට පාසල් පුස්තකාලයාධිපති නායකයා සහ උපදේශාත්මක හවුල්කරුවා දක්වා : පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපති අධ්‍යාපනඥනයන් සඳහා පරිවර්තනීය රාමුවක්


ශීලා බේකර්

හූස්ටන් විශ්වවිද්‍යාලය ක්ලියර් ලේක්, ඇමරිකා එක්සත් ජනපදය



මෙම පත්‍රිකාව පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන්, පරිවර්තනීය නායකයන් සහ උපදේශාත්මක හවුල්කරුවන් බවට පත් කිරීම පිණිස සූදානම් කිරීමට රාමුවක් අධ්‍යාපනඥයින්ට සපයයි. නායකත්වය, එහි කේන්ද්‍රීය අවධානය ලෙස සලකන මෙම සංකල්පීය රාමුවට මෙවලම් (Tools) , පුහුණුව (Training), කාලය (Time), ඉලක්ක (Targets) සහ විශ්වාසය (Trust) ගොඩනැංවීම ඇතුළත් වේ. මෙම ගොඩනැංවීම් පාසල් පුස්තකාලයාධිපති නායකත්වයට, විදුහල්පති නායකත්වයට සහ පරිවර්තනය සිදු වන සන්දර්භයට සම්බන්ධව පැහැදිලි කෙරේ. මෙය T6 ආදර්ශයේ ප්‍රමිති සහ මාර්ගදර්ශක ක්‍රියාත්මක කිරීම සඳහාත් නායකත්වයට සහ සහයෝගිතාවට ඇති බාධක ප්‍රායෝගිකව ජය ගැනීමට අවශ්‍ය මෙවලම් සහ උපායමාර්ගවල දී සියලු පාසල් පුස්තකාලයාධිපතීන් සූදානම් කිරීම සඳහාත් භාවිත කළ හැකිය.

## හැඳින්වීම

ක්‍රි.පූ. පස්වන සියවස තරම් ඈත කාලයක දී ග්‍රීක දාර්ශනික හෙරක්ලීටස් ප්‍රකාශ කර ඇත්තේ ''නොවෙනස් වන එකම දෙය වෙනස් වීමයි'' යනුවෙනි. මෙම වෙනස්වීම වර්තමාන පාසල්වල දක්නට ලැබේ. එහෙයින් වර්තමාන තාක්ෂණික ලෝකය සහ නවෝත්පාදක සමාජය තුළ අනාගත පුස්තකාලයාධිපතීන් සූදානම් කිරීමේ අභියෝගය භාර ගැනීම හදිසි කාර්යයක් වේ. වත්මන් ඩිජිටල් ලෝකයේ වේගය සමග සමපාත වීමට පාසලේ ව්‍යුහය, සංස්කෘතිය සහ දිශානතිය බරපතළ වෙනසකට බඳුන් වීම අවශ්‍යය. පාසල් පුස්තකාලයාධිපති සූදානම් කිරීමේ වැඩසටහන් පරිවර්තනීය පාසල් නායකයන් සහ උපදේශාත්මක හවුල්කරුවන් බවට පත් කිරීම සඳහා වන අපගේ සිසුන් කුසලතාවලින් සන්නද්ධ කළ යුතුය. සූදානම් කරන වැඩසටහන්වල දී අධ්‍යාපනඥයන් දැනුවත් කිරීම යෝජිත ආදර්ශයට, එනම්, පරිවර්තනයේ T6 ට කළ හැකිය. අධ්‍යාපනඥයන් විසින් මෙම රාමුව භාවිත කිරීම මගින් සමස්ත පාසල් ප්‍රජාවට බලපාන නායකයන් සහ වෙනස්වීම් කාරකයන් බවට පත්වීමට පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන්ට පුළුවන.

## පරිවර්තනීය නායකත්වය

නායකයන් සහ අනුගාමිකයන් එකිනෙකාගෙන් අනුප්‍රාණය ලබන සහ උසස් ආචාරධාර්මික හා අභිප්‍රේරණාත්මක මට්ටම් වෙත එකිනෙකා ගොඩනගා ගන්නා අඛණ්ඩ අන්‍යොන්‍ය ක්‍රියාවලියක් ලෙස පරිවර්තනීය නායකත්වය නිර්වචනය කළ හැකිය. (Burns, 1978; 1998) බර්න්ස්ට අනුව පරිවර්තනීය නායකයන් උසස් අභිමතාර්ථවලට සම්බන්ධ වන අතර ඒ සඳහා සහයෝගයෙන් කටයුතු කරයි. බර්න්ස්ගේ න්‍යාය තවදුරටත් ව්‍යාප්ත කරන බාස්ගේ පරිවර්තනීය නායකත්ව න්‍යාය (1985) තර්ක කරනුයේ පරිවර්තනීය නායකයන් විශ්වාසය ගොඩනංවන විට සහ පුහුණු කිරීම හා උපදේශකත්වය හරහා ඉලක්කවලට ළඟා වීම වෙත අවධානය යොමු කරන විට වඩාත් සාර්ථක කාර්යයක් කළ හැකි බවය.

නවෝත්පාදනය සමඟ සමපාත වීමටත් සේවා ස්ථානයේ දී නිර්මාණාත්මක බව වර්ධනය කිරීමටත් මාර්ගයක් ලෙස බොහෝ වෘත්තීන් පරිවර්තනීය නායකත්වය පුළුල්ව පිළිගෙන ඇත. පරිවර්තනය පිළිබඳ T ආදර්ශ බොහොමයක ඒවායේ අභිප්‍රායට විශේෂිත වූ නැවුම් ගොඩනැංවීම් ඇතුළත් වේ. එහෙත් මෙවලම්, කණ්ඩායම් ක්‍රියාකාරීත්වය, පුහුණුව සහ විශ්වාසය වැනි ඇතැම් ගොඩනැංවීම් සමහර මොඩල අතර අනුරූපී වේ. (Arora, 2014; Den Gam, 2006; Persietal, 2013; Robert & Atkins, 2015) පරිවර්තනීය මොඩල බොහොමයක් තිබුණ ද, ස්වකීය පාසල්වල නායකයන් සහ උපදේශාත්මක හවුල්කරුවන් ලෙස තමන් පරිවර්තනය වීමේ දී අනාගත පාසල් පුස්තකාලයාධිපතීන් සූදානම් කිරීමට සහාය වන මොඩලයක් දක්නට නොමැත. මෙම පරිවර්තනීය නායකත්ව ආදර්ශ මත ගොඩනැංවෙන T6 මොඩලය නිර්මාණය වෙයි. එහිදී පාසල් පුස්තකාලයාධිපති නායකත්ව ප්‍රවාහයේ වැදගත්කම පිළිබඳ පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් දැනුවත් කිරීමට අධ්‍යාපනඥයන්ට පුළුවන.

අවසාන වශයෙන්, පරිවර්තනීය නායකත්වය තුළ පවත්නා මෙම අන්තර් ක්‍රියාකාරීත්වය ඉගැන්වීමේ නවෝත්පාදනයන්ට අනුප්‍රාණය සපයන අතර එය අභිප්‍රේරණය කරයි.

## පරිවර්තනීය මොඩලයේ T6 හැඳින්වීම

1 රූපයෙන් දක්වෙන පරිවර්තනීය මොඩලයේ T6 ගුරුවරයාගේ සිට පාසල් පුස්තකාලයාධිපති නායකයා දක්වා සිදුවන ස්වකීය සාර්ථක පරිවර්තනයේ දී පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන්ට මඟ පෙන්වීම සඳහා අධ්‍යාපනඥයන්ට භාවිත කළ හැකි විභව වශයෙන් අත්‍යවශ්‍ය රාමුවකි.




1 රූපයː පරිවර්තනීය ආදර්ශයේ T6

තම සූදානම් කිරීමේ වැඩසටහන්වල දී මෙම ආදර්ශයේ නිර්මාණයන් භාවිත කිරීම මගින් අධ්‍යාපනඥයන් පාසල තුළ ස්වකීය ස්ථානය වටහා ගැනීමට පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන්ට සහාය වනු ඇත. එමෙන්ම කාලයේ, අරමුදල්වල සහ කාර්යමණ්ඩලයේ අප්‍රමාණවත් බව වැනි බාධක ජය ගැනීමට මෙන් ම නායකයන් ලෙස තමන්ගේ භූමිකාව පවරා ගැනීමට අවශ්‍ය මෙවලම් සහ උපායමාර්ග ඔවුනට සපයනු ඇත.

පංතිකාමර ගුරුවරයෙකු ලෙස අත්දැකිය නොහැකි භූමිකාවන් පාසල් පුස්තකාලයාධිපතීන් ලබා ගනී. වෘත්තීය සංවර්ධනය මෙහෙයවීම, තාක්ෂණයන් සහ සම්පත් ඇගයීම, නවෝත්පාදක තාක්ෂණයන් සමෝධානය කිරීම මීට නිදසුන්ය. ඇතැම් ගුරුවරුන් මෙම භූමිකාවන් ඉටු කළ ද එසේ නොකරන ගුරුවරුන්ට පංති කාමරයේ සිට පාසල් පුස්තකාලය දක්වා පරිවර්තනය වීම අභියෝගාත්මක විය හැකිය. පූර්ව දැනුම සහ සහභාගිත්ව අත්දැකීම් මත පදනම්ව ඇතැම් ගුරුවරුන්ට T6 මොඩලයේ නිර්මාණයන් පිළිබඳ අවබෝධයක් තිබිය හැකිය. කෙසේ වෙතත්, තවත් සමහර ගුරුවරුන්ට එවන් අවබෝධයක් නොතිබීමට පුළුවන. පාසල් පුස්තකාලයාධිපතීත්වය සඳහා වන ස්වකීය අධ්‍යාපනයේ දී පංති කාමරයේ සිට පැමිණෙන නව සිසුන්ට තම පංතිකාමර චර්යාවේ සිට පාසල් පුස්තකාලයාධිපතීත්වයේ වගකීම් සහ නායකත්වය දක්වා අනුරූපණය වීමට එතරම් පුහුණුවක් නොමැත. මෙම මොඩලය ගුරුවරයාගේ මානසිකත්වයේ සිට පාසල් පුස්තකාලයාධිපතීන්ගේ මානසිකත්වය දක්වා යොමු වීමේ දී සිසුවාටත් ස්වකීය ව්‍යවහාරයේ සන්දර්භය තුළ තම භූමිකාවන් අවශෝෂණය කර ගැනීමට පූර්ව සේවා ගුරුවරුන්ට උදව් කිරීමේ දී අධ්‍යාපනඥයන්ටත් සහාය වේ.

මෙම රාමුවෙහි පදනම වන්නේ ගුරුවරයාගේ සිට පාසල් පුස්තකාලයාධිපති දක්වා පරිවර්තනය සංරචක කිහිපයක් මත මෙහෙයවෙන බව අවබෝධ කර ගැනීමය. එනම්, මෙවලම්, පුහුණුව, කාලය, ඉලක්ක සහ විශ්වාසයයි. T6 මොඩලයේ පාසල් පුස්තකාලයාධිපති කේන්ද්‍රීය නායකත්ව තත්ත්වයක ස්ථානගත කරයි. එමෙන් ම එය ඉලක්ක කරන කලාප සහ චර්යාවන් ආවරණය කිරීම සඳහා පැහැදිලි රාමුවක් සපයයි. මෙහිදී විදුහල්පතිගේ නායකත්වය වෙත ද සැලකිල්ල දක්වන අතර පාසල් පුස්තකාලයාධිපතීන් මෙහෙයවන සන්දර්භය ද සලකා බලනු ලැබේ. මෙම මොඩලයේ ගොඩනැංවීම් ඇමරිකානු පාසල් පුස්තකාල සංගමයේ (AASL) ඉගෙනුම්ලාභීන් සවිබලගැන්වීම (2009), පාසල් පුස්තකාලයාධිපතීන්ගේ මූලික සූදානම සඳහා වන ඇමරිකානු පුස්තකාල සංගමයේ ප්‍රමිති (ALA) (2010) සහ නායකත්වය සවිබලගැන්වීම (Marfin, 2013) සමඟ එකට බැඳෙයි. මෙම සියලු ගොඩනැංවීම් අන්තර් සම්බන්ධිතය. එමෙන්ම ව්‍යවහාරයේ දී ස්වකීය නායකත්ව සහ හවුල්කාර භූමිකාවන් පරිවර්තනයට සහ සාර්ථකව පවරා ගැනීමට මෙම සියලු සංරචක පිළිබඳ ක්‍රියාකාරී අවබෝධයක් පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන්ට තිබිය යුතුය.

## පාසල් පුස්තකාලයාධිපති නායකත්වය

නායකත්වය පාසල් පුස්තකාලයාධිපතීන් සඳහා අත්‍යවශ්‍ය ගුණාංගයක් සේ සැලකේ. එමෙන්ම ප්‍රාන්තීය සහ ජාතික මාර්ගදර්ශක මගින් පෙන්වා දී ඇති පරිදි ස්වකීය අර්ථවත් නායකත්ව භූමිකාව පවරා ගැනීමට අවස්ථාවක් වත්මන් උසස් තාක්ෂණික පරිසරය පාසල් පුස්තකාලයාධිපතීන්ට ලබා දෙයි. තාක්ෂණික සමෝධානයේ දී අර්ථවත් භූමිකාවක් පවරා ගැනීමට සුදුසු නායකත්වයක පාසල් පුස්තකාලයාධිපතීන් සිටින බවට පර්යේෂකයන් තර්ක කර ඇත. (Everhart, Mrdis සහ Johnston, 2011; Hughes- Hassell සහ Hanson- Baldaut, 2008; Kuhlthau, 2010) නව තාක්ෂණයේ දියුණුව සහ අර්ථවත් සමෝධානයට සමාන්තරව නායකයන් ලෙස පාසල් පුස්තකාලයාධිපතීන් අඛණ්ඩව පරිණාමය වෙයි. එමෙන්ම විදුහල්පතිවරුන් විසින් ඔවුන් සවිබල ගන්වා සහාය ලබා දුන් විට උපදේශාත්මක හවුල්කාරත්වය සහ තාක්ෂණික සමෝධානය හරහා ඉගැන්වීමේ සහ ඉගෙනුමේ පරිවර්තනය වෙත පූර්ව ක්‍රියාකාරී ලෙස සහාය වීමට ඔවුනට පුළුවන.

නිපුණ පාසල් පුස්තකාලයාධිපතීන් ඔවුන්ගේ ව්‍යාපෘතියෙහි නායකයන්; ඔවුන්ගේ පුස්තකාලවල පරිපාලනයේ නායකයන්; ගුරුවරුන්ට සහ සිසුන්ට ඉගෙනුම් අවස්ථා සපයන උපදේශාත්මක නායකයන්ය. (NPBTS, 2012) පාසල් පුස්තකාලයාධිපතීන් යනු 'ඉගෙනුම' සඳහා විසල් අවස්ථාවක් පෙරට ගෙන එන උපදේශාත්මක නායකයන්ය, (P 55) පාසල් පුස්තකාලයාධිපතීන් උපදේශකත්වයේ, පරිපාලනයේ සහ වෘත්තීය නායකත්වයේ වගකීම් පවරා ගැනීම මගින් පුස්තකාල හා මාධ්‍ය වැඩසටහන ශක්තිමත් කරන අතර එයට සංගත සහ ඉදිරි දැක්මක් සහිත උපදේශාත්මක නායකත්වයක් සපයයි. (P 42) ඉගෙනුම සඳහා විසල් අවස්ථාවක් ලෙස දැකිය යුතු උපදේශාත්මක හවුල්කාරත්වය හරහා උපදේශාත්මක නායකත්වය සාක්ෂාත් කර ගත හැකිය.

වෙනස් වන තාක්ෂණයන්ගේ අවශ්‍යතාවන් මෙන්ම බහුවිධ සාක්ෂරතාවන්හි කුසලතාපූර්ණ වීමට ඇති ඉගෙනුම්ලාභීන්ගේ අවශ්‍යතාවන් සපුරාලීමේ දී සහ සදාතනිකව පරිණාමය වන අපගේ තාක්ෂණික සමාජය තුළ සාර්ථකත්වයට අවශ්‍ය කුසලතා සහ දැනුම ඉගෙනුම්ලාභීන්ට සැපයීම සහතික කිරීමේ දී පාසල් පුස්තකාලයාධිපතීන්ගේ නායකත්ව භූමිකාව වැදගත් වන බව ඇමරිකානු පාසල් පුස්තකාල සංගමයේ මාර්ගදර්ශක අවධාරණය කරයි. මෙම පාසල් පුස්තකාල වැඩසටහන ගොඩනංවනු ලබන්නේ 21 වන සියවසේ තාක්ෂණික සමාජය තුළ සාර්ථක වීමට අවශ්‍ය කුසලතාවලින් සහ දැනුමෙන් ඉගෙනුම්ලාභීන්ගේ සන්නද්ධ බව සහතික කිරීමට, ප්‍රජාව සඳහා නායකත්වය සහ විශිෂ්ට ව්‍යවහාර නිරූපණය කරන වෘත්තීයවේදීන් විසින් බව ද එම මාර්ගදර්ශක සඳහන් කරයි. (2009, p 45)

වෘත්තීය වශයෙන් පුහුණුව ලත් පාසල් පුස්තකාලයාධිපතීන් විශිෂ්ට ව්‍යවහාර ක්‍රියාත්මක කිරීමේ දී සහ පරිවර්තනය තුළ ගුරුවරුන් ඩිජිටල් අධ්‍යාපනඥයන් බවට පත් කිරීමේ දී පූර්ව ක්‍රියාකාරී වෙයි. ඔවුනට විදුහල්පතිගේ දැක්මට සහාය විය හැකි අතර පරිවර්තන ක්‍රියාවලියේ දී ගුරුවරුන් ඉදිරියට යොමු කිරීමට එම දැක්ම සංවර්ධනය කිරීමේ දී විදුහල්පතිට සහාය විය හැකිය. එමෙන්ම තාක්ෂණය භාවිතයේ දී

නායකයන් බවට පත් වීමට ගුරුවරුන් සවිබල ගැන්වීමටත් ඉගැන්වීම සහ ඉගෙනුම වෙත එහි ඵලදායී සමෝධානයටත් ඔවුන්ගේ දැනුම සහ උද්‍යෝගය බෙදා හදා ගත හැකිය. ශ්‍රේණි මට්ටමේ විෂය මාලාවට නියත මෙවලම් සහ සම්පත් සැපයීමෙන් ද තාක්ෂණය සමඟ ඉගැන්වීම සහ ඉගෙනුම සඳහා ඇති නවතම විශිෂ්ට ව්‍යවහාර හා ක්‍රමවේද පිළිබඳ ඔවුන් දැනුවත් කිරීමෙන් ද පරිවර්තනයේ අඛණ්ඩතාව පුරා අවදානමින් තොර සහායශීලී පරිසරයක් නිර්මාණය කිරීමෙන් ද පාසල් පුස්තකාලයාධිපතීන් තමන්ගේ පහසු මට්ටමේ දී ගුරුවරුන්ගේ අවශ්‍යතා සපුරාලයි.

සිසු ඉගෙනුමට හොඳින් ම බලපෑම් කිරීම සඳහා ස්වකීය පුස්තකාල වැඩසටහන සැලසුම් කරන ආකාරය ගැන Empowering Leaners මාර්ගදර්ශක (2009) පාසල් පුස්තකාලයාධිපතීන්ට මඟ පෙන්වයි. පාසල තුළ නායකත්වය ප්‍රදර්ශනය කරන පාසල් පුස්තකාලයාධිපතීන්ට ශිෂ්‍ය සාධන මට්ටම කෙරෙහි බලපෑමටත් සිසු අභිප්‍රේරණය සහ ජයග්‍රහණ ප්‍රවර්ධනයේ දී අර්ථවත් සහ වැදගත් ඉගෙනුම් අවස්ථා සැපයීමටත් මහඟු විභවයක් තිබේ. (Weimer සහ Hall, 2006) ඵලදායී පාසල් පුස්තකාල වැඩසටහන් සහිත පාසල්වල සිසුන් ඵලදායී පාසල් පුස්තකාලයාධිපති නායකත්වයක් නොමැති පාසල්වල සම මට්ටමේ සිසුන්ට වඩා හොඳින් ඉගෙන ගන්නා බවත්, ඉහළ ශ්‍රේණි ගන්නා බවත්, ප්‍රමිත පරීක්ෂණවල දී ඉහළ ලකුණු ගන්නා බවත් අධ්‍යයනවලින් පෙන්වා දී ඇත. ශිෂ්‍ය සාධනය වෙත පාසල් පුස්තකාල සහ පුස්තකාලයාධිපතීන්ගේ බලපෑම පිළිබඳ ආනුභවික අධ්‍යයනවල දශක දෙකකට ආසන්න කාලයක පර්යේෂණ ප්‍රතිඵල පෙන්වා දෙන්නේ (Scholastic, 2008) නායකත්වය සහ තාක්ෂණය යනු පාසල් පුස්තකාලයාධිපතීන්ගේ විශේෂඥතාව ශිෂ්‍ය සාධනයට බලපාන ප්‍රධාන අංශ දෙක බවය. පාසල්වල තාක්ෂණයේ භාවිතය සඳහා ඇති මාවත වෙත මෙහෙයවනුයේ පාසල් පුස්තකාල බව වාර්තාවේ සොයා ගැනීම් සඳහන් කරයි. (p 4) පාසල් පුස්තකාල වැඩසටහනේ සමහර සංරචක ශිෂ්‍ය සාධනය සමඟ ධනාත්මක සබඳතාවක් තිබේ. පුස්තකාලයාධිපතීන් විසින් ගුරුවරුන් සඳහා වෘත්තීය සංවර්ධන පුහුණුව ලබා දීම (Lance, Rodney සහ Russel, 2007; Lance, Rodney සහ Schwrz ; 2010) , ගුරුවරුන්ට තාක්ෂණික සහාය සැපයීම (Lance: Rodney සහ Schwrz, 2010; Smith, 2006; Todd, 2005; Todd සහ Kuhlthau, 2003) , සහ පුස්තකාලයාධිපතීන් සහ ගුරුවරුන් අතර සහයෝගීතාව (Farmer, 2006; Haycock; 2007; Lance, Rodeny සහ Hamilton- Pennell, 2000; Lance, Rodney සහ Schwrz, 2010; Rodney, Lance සහ Hamilton-Pennell, 2002) මෙම සංරචකවලට ඇතුළත් වේ. පුස්තකාල වැඩසටහන් විශිෂ්ට ව්‍යවහාර සමඟ මෙහෙය වීමේ දී වත්මන් පාසල් පුස්තකාලයාධිපති නවෝත්පාදකයෙකු, පරිවර්තනකාරයෙකු සහ තාක්ෂණ සමෝධාන නායකයෙකු ලෙස ක්‍රියා කරයි. (Smith, 2006. P. 16) නවෝත්පාදක තාක්ෂණයන්, පාසල් ව්‍යාප්ත විෂයමාලා අන්තර්ගතය, ඵලදායී සහයෝගය සඳහා උපායමාර්ග, ඉගැන්වීම සහ ඉගෙනුම වෙතට උපදේශාත්මක තාක්ෂණයන් සමෝධානය සඳහා ඉගැන්වීම් විද්‍යාත්මක උපායමාර්ග පිළිබඳ දැනුම සමඟ පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපති දැනුවත් කිරීම ඔවුන් ස්වකීය පාසල් තුළ වැදගත් උපදේශාත්මක හවුල්කරුවන් කරනු ඇත.

**මෙවලම්**

මෙවලම් නිර්මාණයට ඇතුළත් වන්නේ ඉගැන්වීමේ දී සහ ඉගෙනුමේ දී පාසලේ විවිධත්වයෙන් යුත් ජනගහනයකට සහාය වීමට අවශ්‍ය වූ තාක්ෂණයන්, සම්පත්, කුසලතා සහ දැනුමයි. ඩිජිටල් ඉගෙනුම්ලාභීන්ට අදාළ වන අර්ථවත් ආකාරවලින් සාම්ප්‍රදායික සහ නව තොරතුරු සාක්ෂර කුසලතා සමෝධානය කෙරෙන හෙයින් අලුතින් මතුවන තාක්ෂණයන් නව ඉගැන්වීම් සහ ඉගෙනුම් හැකියාවන් සඳහා විභවය ජනනය කර ඇත. තාක්ෂණය සමෝධානය, ඉගැන්වීම් විද්‍යාත්මක ව්‍යවහාර සහ විෂයමාලා අන්තර්ගතය යනාදියේ දී පාසල් පුස්තකාල තිබෙනුයේ පෙරමුණෙහිය. එමෙන්ම පංතිකාමරය සහ විෂයමාලාව පුරා තාක්ෂණය සමෝධානය කිරීමේ දී නායකත්වය සැපයීමට ඒවායේ පුස්තකාලයාධිපතින්ට පුළුවන. (Scholastic, 2008)

තාක්ෂණ දියුණුව පැවතිය ද ඒවා ස්වකීය විෂයමාලාවට ඵලදායීව සමෝධානය කිරීමට බොහෝ ගුරුවරු වෙහෙසති. මීට අදාළ සාහිත්‍ය පෙන්වා දෙන්නේ ඉගැන්වීම් ව්‍යවහාර වෙත ඵලදායී තාක්ෂණ භාවිතය සහ සමෝධානය පංති කාමරවල අඩුවෙන් දැකිය හැකි බවය. (Angeli සහ Valanides, 2009; Ertmer, 2005, Ertmer සහ Offenbreit- Leffwich, 2010; Hue සහ Brush, 2007; Koksal, Yaman සහ Sake, 2016; O'Hara, Pitchard, Hnang සහ Pella, 2012) ඉගැන්වීම වෙතට තාක්ෂණය සමෝධානය සඳහා ගුරුවරුන්ගේ දැනුම සංවර්ධනය කිරීමේ දී පරිගණක, ටැබ්ලට් සහ ඩිජිටල් සම්පත්වල ගුණාත්මකභාවය සහ ඒවා වෙත ප්‍රවේශකත්වය එක් සාධකයක් වේ. (Hosseim @ Tee, 2012) මිලර් (2010) යෝජනා කරනුයේ පුද්ගලයන් දෙන ලද සම්පත්වලින් උපරිමයෙන් වැඩ කළ යුතු වුවත් ඔවුන්ට සාර්ථක වීම සඳහා අවශ්‍ය මෙවලම් සංවිධාන විසින් ඔවුනට ලබා දීම ඒ හා සමානව වැදගත් බවය. (p 27) නිවැරදි මෙවලම් මෙන්ම එම මෙවලම් ඵලදායීව සමෝධානය කිරීමට දැනුම සහ කුසලතා පැවතීම තම රැකියාව ඉටු කිරීමට විශ්වාසයක් පුද්ගලයන්ට ලබා දෙයි.

පාසල් පුස්තකාලයාධිපතීන්ගේ මූලික සූදානම් කිරීම සඳහා වන ALA/AASL ප්‍රමිති විසින් විවිධ ඉගෙනුම් ශෛලීන් සහ රුචිකත්වයන්ටත් විමසුම, විචාරාත්මකව සිතීම සහ නව දැනුම ලබා ගැනීම හා නිර්මාණය සඳහා සියලු සිසුන්ගේ හැකියාවන්ටත් සහාය වීමට විවිධ උපදේශාත්මක උපායමාර්ග වෙතට අලුතින් මතුවන තාක්ෂණයන් සමෝධානය කිරීම පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන්ට පවරනු ලබයි. (P.3) මිස්රා සහ කොහ්ලර් (2006; 2008) තර්ක කරනුයේ තාක්ෂණය ඵලදායීව සමෝධානය කිරීමට තාක්ෂණය, ඉගැන්වීම් ක්‍රමවේද සහ අන්තර්ගතය අතර පවත්නා සබඳතාව පිළිබඳ දැනුම සහ අවබෝධය ගුරුවරුන්ට අවශ්‍ය බවය. රාජකාරියේ දී සහ දෛනික ජීවිතයේ දී තාක්ෂණය පුළුල් ලෙස ඵලදායීව ව්‍යවහාර කිරීමටත් අභිමතාර්ථයක් සාක්ෂාත් කිරීමට තොරතුරු තාක්ෂණය සහාය වන හෝ බාධා වන අවස්ථාව හඳුනා ගැනීමටත් තොරතුරු තාක්ෂණයේ සිදු වන වෙනස්කම් අඛණ්ඩව අනුගත කිරීමටත් ගුරුවරුන්ට ස්වකීය සබඳතා අවබෝධ කර ගැනීමට සහාය වීමට පූර්ව සේවා පුස්තකාලයාධිපතීන් මෙම ක්ෂේත්‍රවල තම විශේෂඥතාව බෙදා හදා ගැනීම අවශ්‍යය. (p 15) ඔවුන්

ඉගැන්වීම සහ ඉගෙනුමේ දී ඵලදායී සහ කාර්යක්ෂම භාවිතය සඳහා නියත තාක්ෂණයන් පිළිබඳ ගැඹුරු අවබෝධයක් සහ ප්‍රවීණත්වයක් ලබා ගැනීමට ගුරුවරුන්ට සහාය වනු ඇත.

ස්වකීය වාසි සහ අවාසි වෙනුවෙන් තාක්ෂණයෙන් විශ්ලේෂණය කිරීමේ දී සහ එම තාක්ෂණයන් ඵලදායීව භාවිත කිරීමට ඇති හොඳම ප්‍රවේශයන් ආකෘතිගත කිරීමේ දී පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් විශේෂඥතාව අත් කරගත යුතුය. ඵලදායී සම්පත් සොයා ගැනීමට උපකාරී වීමෙන් ද වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීමෙන් හා ඊට සහාය වීමෙන් දි ඉගෙනුම සහ වෘද්ධිය සඳහා අවස්ථාවන්ගේ විවිධත්වයක් ගුරුවරුන්ට සැපයීමට ඔවුනට හැකිය. (Stapler, Pugach සහ Himes, 2005) උපදේශාත්මක අභිමථාර්ථවලට සහාය වීමට වඩාත් ගැළපෙන මෙවලම් සහ වේදිකාවන් තේරීමේ දී සහ නියත විෂය කරුණු ඉගැන්වීමේ දී සහ ඉගෙනීමේ දී ගුරුවරුන්ට මඟ පෙන්වන ආකාරය ඉගෙනීම සඳහා මෙම කුසලතා සහ අවස්ථාවන් පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන්ට උපකාරී වනු ඇත. ඔවුන් ස්වකීය ඉගැන්වීමේ දී භාවිත කළ යුතු තාක්ෂණය සහ එය කාර්යක්ෂමව සහ ඵලදායීව භාවිත කරන ආකාරය මත පදනම් වූ මෙවලමක් තෝරා ගන්නා විට නිපුණ ගුරුවරු අර්ථවත් ඉගෙනුමක් ප්‍රවර්ධනය කරති. විවිධ තාක්ෂණයන් භාවිතය සඳහා ඉගැන්වීම් ක්‍රම විද්‍යාත්මක උපායමාර්ග ව්‍යවහාර කිරීමට ගුරුවරුන්ට උදව් වන ආකාරයත් ඉගැන්වීමේ දී සහ පරිවර්තනයේ දී වෙනස්වීමට බලපාන නියත තාක්ෂණය භාවිත කරන ආකාරය අවබෝධ කර ගැනීමට ඔවුන්ට උදව් වීමටත් පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් ඉගෙන ගත යුතුය. එමෙන්ම පාඩම් අභිමතාර්ථ සහ ඉගෙනුම් ඵල සාක්ෂාත් කර ගැනීමට විෂය අන්තර්ගතය සමඟ තාක්ෂණ මෙවලම් ඵලදායීව ගලපන ආකාරය පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් ඉගෙන ගත යුතුය. Angeli සහ Valanides (2009) ට අනුව තාක්ෂණය ඉගැන්වීම් විද්‍යාත්මකව සමෝධානය කිරීමට පෙර ගුරුවරුන් නියත තාක්ෂණය දරා ගැනීම පරිකල්පනය කර අවබෝධ කර ගත යුතුය. (p 4665)

තොරතුරු වෙත ප්‍රවේශය, අර්ථකථනය සහ සන්නිවේදනයට සහාය වන වර්තමාන සහ බිහි වෙමින් පවතින තාක්ෂණයන්ගේ භාවිතය හරහා සිසුන් සහ ඔවුන්ගේ පාසලේ සහ ප්‍රජාවේ අනෙකුත් සාමාජිකයන් සඳහා තොරතුරු වෙත ප්‍රවේශය ඉහළ නැංවීමට පාසල් පුස්තකාලයාධිපති සූදානම් කිරීමේ ප්‍රමිති අධ්‍යාපනඥයන් දිරි ගන්වයි. (ALA/ AASL, 2010, p11) පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් විවිධ ආකෘතිවලින් තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා පහසුකම් සලසන ආකාරය දැන ගත යුතු අතර විවිධත්වයෙන් යුත් ඉගෙනුම් ප්‍රජාවකගේ අවශ්‍යතාවලට සහාය වන තොරතුරු මූලාශ්‍ර සහ සේවා පිළිබඳ ඔවුන්ගේ දැනුම විදහා දැක්විය යුතුය. ඔවුන් ඩිජිටල් සමාජයක් තුළ ඉගැන්වීමට සහ ඉගෙනුමට සහාය වීම සඳහා සාධිකාරී තොරතුරු සම්පත් වෙත ප්‍රවේශ වීමට සහ ඒවා සැපයීමට ඇති ඩිජිටල් තාක්ෂණයන්ගේ ඵලදායී භාවිතය ප්‍රදර්ශනය කළ යුතුය. මෙයට අමතරව ඔවුන් ක්ෂේත්‍රයේ වර්තමාන ප්‍රවණතා සහ බිහි වෙමින් පවතින තාක්ෂණයන් මෙන්ම වෘත්තීමය ජාලකරණය සහ වෘද්ධිය සමඟ එක පෙළට පැවතීමටත් වෘත්තීමය වගකීම්හි බැඳීමටත් වෘත්තිය වෙනුවෙන් පෙනී සිටීමටත් තාක්ෂණයන් සහ සම්පත් කාර්යක්ෂමව භාවිත කළ යුතුය.

**පුහුණුව**

පුහුණු කිරීම, හුරු කිරීම සහ උපදෙස් සැපයීම ඇතුළු පුහුණු වින්‍යාසය සෑම කේවල ගුරුවරයෙකුගේ ම අවශ්‍යතා මත රඳා පවතී. විෂයමාලා අන්තර්ගත ක්ෂේත්‍ර තුළ තාක්ෂණයන් සහ සම්පත් සමෝධානය කිරීම සඳහා තාක්ෂණික මෙවලම් සහ වේදිකාවන් මෙන්ම ඉගැන්වීම් විද්‍යාත්මක උපායමාර්ග පිළිබඳ ස්වකීය දැනුම වැඩි දියුණු කිරීම පිණිස ඵලදායී වෘත්තීය සංවර්ධනයක් සැපයීමට ඔවුන්ගේ පාසල් පුස්තකාලයාධිපතීන් මත රඳා පැවතීමට ගුරුවරුන්ට හැකි විය යුතුය. විෂය ක්ෂේත්‍ර තුළ අන්තර්ගත දැනුම වෙත පවත්නා අවධානයන් ඇතුළත් සූදානම් කිරීමේ වැඩ සටහන් සහ පුහුණුව මෙන් ම ඉගැන්වීම් විද්‍යාත්මක අන්තර්ගත දැනුම පෙන්වා දෙන්නේ ඵලදායී තාක්ෂණ සමෝධානයෙහි කැපී පෙනෙන ප්‍රතිඵලයි. (Blank, dellas Alas සහ Smith, 2008) ගුරුවරුන් ඉලක්ක කරන ඉහළ ගුණාත්මක අගයෙන් යුත් කාර්යමණ්ඩල සංවර්ධනයන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම, සේවයේ යෙදී සිටින පාසල් පුස්තකාලයාධිපතීන්ගෙන් අපේක්ෂා කෙරේ. පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් නව තාක්ෂණයන් හඳුන්වා දීම සඳහා වෘත්තීය සංවර්ධනය සැපයීමට පමණක් ඉගෙන නොගත යුතුය. ඔවුන් පුහුණු කිරීමේ, උපදෙස් දීමේ සහ මඟ පෙන්වීමේ මාදිලිය තුළ, අඛණ්ඩ සහායක් සැපයීම සඳහා වන උපායමාර්ග ද ඉගෙන ගත යුතුය. පුහුණුව මගින් නිර්මාණය කෙරෙනුයේ වගකීම, අවනත බව සහ විශ්වාසය ගොඩනංවන තියුණු, හැකියාව සහිත සහ ගැටලු විසඳීමට සූදානම් සාමාජික කණ්ඩායමකි. මෙහි දී නිපුණත්වය සඳහන් නොවේ. (Miller, 2010, P.140) හුරු කරවීම පුද්ගලයාගේ මෙන් ම සංවිධානයේ ද සාර්ථකත්වයට අවශ්‍ය වේ. (P.157) හොඳ ම හුරු කරවීම සිදු වනුයේ දෛනිකව සහ මොහොතින් මොහොතටය. (P.160)

පූර්ව සේවා පුස්තකාලයාධිපතීන් ස්වකීය සූදානම් කිරීමේ වැඩසටහන්වල දී සහයෝගීතාව සහ වෘත්තීය සංවර්ධන අවස්ථා මෙහෙය වීම සමඟ සවිබල ගැන්වෙයි. (ALA/ AASL, 2010) පූර්ව සේවා පුස්තකාලයාධිපතීන් සිසු ඉගෙනුමේ සහාය ඇතිව ඵලදායී ලෙස තාක්ෂණයන් සහ සම්පත් භාවිත කිරීමේ දී ගුරු බලකාය දැනුමෙන් සන්නද්ධ කිරීම සඳහා විශේෂඥතාව අත් කර ගත යුතුය. ගුරුවරුන්ගේ කුසලතා සංවර්ධනය කිරීමේ දී ඔවුනට සහාය වන විවිධ ඉගැන්වීම් සහ තාක්ෂණයන් සමෝධානය කරන මාදිලි ගැන ඔවුන්ට පිරිපුන් දැනුමක් පැවතීම අවශ්‍යය. එවිට පංතිකාමරයේ දී ඉක්මනින් ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික මෙවලම් සහ උපායමාර්ග ගුරුවරුන්ට ලබා දීමට ඔවුනට හැකි වේ. නිරූපණය, උපදේශනය සහ සහයෝගිතාව හරහා ගුරුවරුන්ගේ අවශ්‍යතා සපුරාලීමට යෝග්‍ය වෘත්තීය සංවර්ධනය, මෙහෙයවීම සහ සහාය සැපයීමට ඔවුනට හැකි විය යුතුය. මෙය විෂයමාලාව වෙතට නවෝත්පාදක තාක්ෂණයන් ඵලදායීව සමෝධානය කිරීමට අවශ්‍ය වූ තාක්ෂණික කුසලතා සහ ඉගැන්වීම් ක්‍රම විද්‍යාත්මක උපායමාර්ග ගුරුවරුන් විසින් අත්කර ගැනීමට සමානය. කැපී පෙනෙන වෘත්තීය සංවර්ධනයක් ලබා ගන්නා ගුරුවරුන්ට ශිෂ්‍ය සාධනය පිළිබඳ ධනාත්මක සහ ප්‍රබල බලපෑමක් එල්ල කිරීමට ඇති හැකියාව මෙන් ම මෙය ද තීරණාත්මකය. (Biancarosa , Brylc, Dexter, 2010; Wallace, 2009; Yoon, Duncan, Lee, Scarloss සහ Shipley, 2007)

විශ්වසනීය සහ අදාළ ඉගෙනුම් අත්දැකීම් සංවර්ධනයේ දී පුහුණුව, උපදේශාත්මක උපාය මාර්ගවලට සම්බන්ධ වීම, යාවජීව ඉගෙනුම සහ ශිෂ්‍ය සාධනයේ සහාය තුළ කියවීම් උපදෙස් ලබා දීම, කාර්යක්ෂම සහ ආචාරධාර්මික තොරතුරු ගවේෂණ චර්යා, පාසලේ සංවර්ධනය සහ බුද්ධිමය නිදහස, බුද්ධිමය දේපළ හා පෞද්ගලිකත්වයට ඇති අයිතිය සමඟ බැඳුණු ඩිජිටල් පුරවැසිභාවය වෘත්තීය සංවර්ධනයට අයත් වේ. නවෝත්පාදක තාක්ෂණයන්ගේ අර්ථවත් සමෝධානය හා බැඳුණු වෘත්තීය සංවර්ධනයට විශේෂ අවධානය යොමු කළ යුතුය. තමන් ම තාක්ෂණික නායකයන් බවට පත් වීම සඳහා ගුරුවරුන් සවිබල ගැන්වීම දෙසට ගුරුවරුන් මෙහෙයවීම වෘත්තීය සංවර්ධනයට පුළුවන. ඵලදායී ඩිජිටල් අධ්‍යාපඥනයන් වීමට අවශ්‍ය මෙවලම්, දැනුම සහ සහාය සැපයීමෙන්, අලුතින් බිහිවන සහ දියුණුවන තාක්ෂණයන් වෙතට ස්වකීය කුසලතා සහ දැනුම ව්‍යවහාර කිරීමටත් අදාළ ඉගැන්වීම් සහ ඉගෙනුම සඳහා වන නියත අභිප්‍රායන් වෙනුවෙන් තොරතුරු සොයා ගෙන, ඇගයීමට ලක් කර සදාචාරාත්මකව භාවිත කිරීමට ඔවුනට හැකියාව ලබා දෙන තාක්ෂණයන් වෙත තම දැනුම හා කුසලතා ව්‍යවහාර කිරීමටත් ඇති ඔවුන්ගේ හැකියාව ගැන විශ්වාසයක් ජනිත කර ගැනීමට ගුරුවරුන්ට හැකිය.

## කණ්ඩායම්

කණ්ඩායම් නිර්මාණය සහයෝගිතාවේ, හවුල්කාරිත්වයේ සහ ප්‍රජා මැදිහත්වීමේ බොහෝ මාදිලිවල වටයක් සාදයි. සහයෝගිත්ව ශ්‍රේණි මට්ටම් හෝ අන්තර්ගත ක්ෂේත්‍ර කණ්ඩායම්, එකක් මත එකක් හවුල්කාරත්වය සහ ප්‍රජාවේ කණ්ඩායම් එක්සත් කරන කණ්ඩායම් මීට ඇතුළත් වේ. කණ්ඩායම්වල නිර්මිතිය සන්නිවේදනයේ සහ සහායේ ජාලයක් ජනනය කරයි. එය පොදු අරමුණු වෙතට වෘත්තීය සහායන් සහ අරමුණු එක්තැන් කරයි.

පාසල් පුස්තකාල වැඩසටහන ඉගෙනුම් ප්‍රජාවේ සාමාජිකයන් අතර සහයෝගිතාව දිරි ගන්වයි. (AASL, 2009) විෂයමාලාව තුළ තාක්ෂණය ඵලදායීව සමෝධානය කිරීමට අවශ්‍ය නවෝත්පාදන තාක්ෂණයන් මෙන් ම තාක්ෂණික කුසලතා සහ ඉගැන්වීම් ක්‍රම විද්‍යාත්මක උපායමාර්ග ගැන අවබෝධයක් අත් කර ගැනීමට ඇතැම් ගුරුවරුන්ට සහයෝගිතාව අවශ්‍ය වේ. පුස්තකාල විද්‍යා සාහිත්‍ය පුරා ගුරුවරයා/ පුස්තකාලයාධිපති සහයෝගිතාව ප්‍රවර්ධනය කර තිබුණ ද ඊට පුළුල් පිළිගැනීමක් අත් කර ගැනීමට ඇති අභියෝගය අඛණ්ඩව පවතී. සහයෝගිතාව සඳහා ඇති නියත බාධක, අධ්‍යාපනඥයන් සහ පුස්තකාලයාධිපතීන් අතර සන්නිවේදනයේ අඩුව, ගුරුවරයා/ පුස්තකාලයාධිපති සහයෝගිතාව සඳහා පූර්ව සේවා සූදානම ප්‍රමාණවත් නොවීම, සහයෝගිතා සංස්කෘතියක් නොමැති පාසල් පසුබිමක සේවය කිරීම හෝ විදුහල්පති සහාය අඩුවීම මීට හේතු විය හැකිය. Moreline (2013) චිත්ත ධෛර්යය, සන්නිවේදන කුසලතා, සහයෝගිතා ව්‍යවහාර, සහයෝගිතාව සඳහා භාවිත කළ තාක්ෂණයන්, උපදේශාත්මක හවුල්කාරත්වය පිළිබඳ බලපෑම් සහගත සහභාගීවන්නන්ගේ අවබෝධය අභියෝග ලෙස හඳුනා ගනී. පාසල් පුස්තකාලයාධිපති සමඟ තිරසර සහයෝගිතාවක් පවත්වා ගෙන යන ගුරුවරුන් ස්වකීය ඉගැන්වීම සඳහා පුස්තකාලයාධිපතිගේ දායකත්වය පිළිගනී. මෙම සහභාගීත්වය දක්වන ගුරුවරුන්ට පුස්තකාලයාධිපති සමඟ සැලැස්මක් අවශ්‍ය බව Kimmel (2012) පවසයි.

Harvey (2011) යෝජනා කරනුයේ පාසල් පුස්තකාලයාධිපති නායකයා නව තාක්ෂණයන් නිරූපණය කරන බවත් විභව ව්‍යාපෘති ගැන සංවාදයන් ආරම්භ කර ස්වකීය ශ්‍රේණි මට්ටම සහ අන්තර්ගත ක්ෂේත්‍රවලට ගැලපෙන තාක්ෂණයන්ට කුඩා කණ්ඩායම් පුරුදු කරන බවය. සාර්ථක කුඩා කණ්ඩායම් පුරුදු කිරීම් හවුල්කාරත්වයන් වෙතට යොමු වන අතර එහි දී එකක් මත එකක් ලෙස උපකාරය ඉක්මනින් ලැබෙන අතර එය කේවල ගුරුවරයාට නිශ්චිත අවශ්‍යතා සපයනු ලැබේ. හවුල්කාරිත්වයෙන් කටයුතු කිරීම සහ ගුරුවරයාගේ අවශ්‍යතා අවබෝධ කර ගැනීම බාධක සහ අභියෝග හරහා ගුරුවරුන්ට මඟ පෙන්වීම සඳහා උදව් කිරීමට ඇති ශිල්පක්‍රම සහ උපායමාර්ග හඳුනා ගැනීමට පුස්තකාලයාධිපතීන් හට හැකියාව ලබා දෙනු ඇත.

තොරතුරු වෙත විවෘත හා සමාන ප්‍රවේශය සහතික කිරීමටත් පාසල් පුස්තකාලයේ සම්පත් හා සේවා වෙත ඇති භෞතික, සමාජීය සහ බුද්ධිමය බාධකවලට විසඳුම් සංවර්ධනය කිරීමටත් උපදේශක කණ්ඩායමක් අවශ්‍ය වේ. (ALA/AASL, 2010, p 11) විවිධ මාධ්‍ය හා සාක්ෂරතාවන්ට සම්බන්ධ සහයෝගිතාව වෙතට ඇති බහුවිධ දක්ෂ වෙතින් අත්දැකීම්, දැනුම සහ විශේෂඥතාව රැගෙන ඒමට සිසුන්, දෙමාපියන්, ගුරුවරුන් සහ ප්‍රජාවේ තවත් අයගෙන් සමන්විත උපදේශක කමිටුවකට පුළුවන.

දිස්ත්‍රික්, ප්‍රාන්තීය සහ ජාතික වෘත්තීයවේදී සංවිධාන ඇතුළු විසල් ප්‍රජාවකගේ සක්‍රීය දායකත්ව සාමාජිකයන් වීමේ වැදගත්කම පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් අවබෝධ කර ගත යුතුය. ඔවුනට පාසල් පුස්තකාලවල නවතම ප්‍රවණතා සහ විශිෂ්ට ව්‍යවහාර සමඟ එක පෙළට සිටීමට වෘත්තීයවේදී සම්පත්, වෙබ් සම්මන්ත්‍රණ, ජාලගත වීම සහ සීමාවාසික රැකියා අවස්ථා යනාදියෙහි වාසිය ලබා ගත හැකිය. ඔවුනට තමන්ගේ දැනුම සහ අත්දැකීම් බෙදාහදා ගත හැකි අතර අලුතින් බිහිවන තාක්ෂණයන් සහ ක්ෂේත්‍රයේ පර්යේෂණ පිළිබඳ නව දැනුම අත්පත් කර ගත හැකිය. වෘත්තීයවේදී සංවිධානවල සාමාජිකයන් සමඟ ජාලගත වීම වෘත්තිය ශක්තිමත් කිරීමටත් ඒ වෙනුවෙන් පෙනී සිටීමටත් අත්‍යවශ්‍යය.

පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් ස්වකීය සූදානම් කිරීම් වැඩසටහන්වල දී උපදේශාත්මක හවුල්කාර අත්දැකීම්වල සෑම මාදිලියක් ම පූර්ව සේවා ගුරුවරුන් සමඟ සක්‍රීයව සම්බන්ධ කළ යුතුය. සහයෝගිත්ව අත්දැකීම් පිළිබඳ අධ්‍යයන විමසීමේ දී, Rawson, Anderson සහ Hughes. Hassell (2015) පෙන්වා දී ඇත්තේ සහයෝගිතාව සඳහා පූර්ව සේවා අධ්‍යාපන සිසුන් සමඟ පූර්ව සේවා පාසල් **පුස්**තකාල සිසුන් හවුල් කරන අන්තර්ශික්ෂණමය පාඨමාලා කටයුතු පාසල් පුස්තකාල වැඩසටහන මගින් සපයනුයේ සුළු වශයෙන් බවය. එහෙත් Hunt සහ Luetkehans (2013) පවසා ඇත්තේ පුහුණු වන පාසල් පුස්තකාලයාධිපතීන් සහ සීමාවාසික ගුරුවරුන් අතර සාර්ථක සහයෝගිතාවක් පවත්නා බවයි. ස්වකීය සූදානම් කිරීමේ වැඩසටහන්වල දී සහයෝගිත්ව හවුල්කාරත්වය තුළ ගුරුවරුන්ගේ සහ පාසල් පුස්තකාලයාධිපතීන්ගේ වටිනාකම පිළිබඳ ඍජු අත්දැකීම් සහ දැනුමක් ලබා ගැනීමට මෙය පූර්ව සේවා ගුරුවරුන් සඳහා පරිපූර්ණ අවස්ථාවකි. මෙම අභිමතාර්ථයේ පැති දෙකකි. භාවිතයේ යෙදීමෙන් ස්වකීය කුසලතා මුවහත් කිරීමට පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් උපදේශාත්මක හවුල්කාරත්වයට සක්‍රීයව සම්බන්ධ වීම එක් පැත්තකි. අනෙක් පස වන්නේ පූර්ව සේවා ගුරුවරුන් මෙම අත්දැකීම්වලින් ලබා ගන්නා දැනුම ව්‍යවහාර කිරීමයි. එහි දී ඔවුන් ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාවලියේ දී

ගුරු/පුස්තකාලයාධිපති සහයෝගිතාවේ විශේෂඥතාව අඛණ්ඩව යොදා ගන්නා අතර පාසල් පුස්තකාලයාධිපතින්ගේ වටිනාකම ඇගයීමට ලක් කරනු ඇත.

**කාලය**

කාලය නිර්මාණය කිරීම පරිවර්තනයේ සහ උපදේශාත්මක හවුල්කාරත්වයේ සාර්ථකත්වයට විශාල වශයෙන් බලපායි. අප්‍රමාණවත් කාලය නායකයෙකු ලෙස පාසල් පුස්තකාලයාධිපතින්ගේ භූමිකාවට ඇති ප්‍රධානතම බාධකය වේ. මෙයට අමතරව, නායකත්ව භූමිකාවෙන් සහ වගකීම්වලින් පිටමං කිරීම, අප්‍රමාණවත් අරමුදල්, අප්‍රමාණවත් කාර්යමණ්ඩල, (Johnston, 2012), සහ තාක්ෂණය ඵලදායීව සමෝධානය කිරීම සඳහා වන උපායමාර්ග පිළිබඳ ගුරුවරුන්ගේ දැනුමෙහි අඩුව අනෙකුත් බාධක වේ. (Hew සහ Brush, 2007; Mishra සහ Keehler, 2006) මේ හා සමානව, Pew පර්යේෂණ මධ්‍යස්ථානය මගින් කරන ලද අධ්‍යයනයෙන් අනාවරණය වූයේ කාලයේ සීමාකම ගුරුවරුන් සඳහා මූලික ම බාධකය බවත් ඇගයීම් සඳහා ඉගැන්වීමට එල්ල වන පීඩනය සහ සම්පත් හිඟකම අනෙකුත් බාධක බවත්ය. (Purcell, Heaps, Buchanan සහ Friedrich, 2013) අධ්‍යාපනයේ දී කාලය සුබෝපභෝගී සම්පතක් ලෙස සැලකේ. එමෙන් ම ගුරුවරුන්ට සහ සිසුන්ට සහාය වීමට ස්වකීය කාලය ඵලදායී ලෙස භාවිත කිරීමට ඔවුනට සහාය වන උපායමාර්ග පිළිබඳ පූර්වසේවා පාසල් පුස්තකාලයාධිපතීන් දැනුවත් විය යුතුය.

ගුරු/ පුස්තකාලයාධිපති උපදේශාත්මක හවුල්කාරත්වය තුළ කාලය ආයෝජනය කළ යුතුය. ගුරුවරුන්ගේ කාර්යබහුල කාල සටහන තුළ ඔවුන්ගේ කාලය සුරැකීමේ දී පූර්වසේවා පාසල් පුස්තකාලයාධිපතීන් තම භූමිකාව වටහාගත යුතුය. අලුතින් බිහිවන තාක්ෂණයන් පිළිබඳ තම දැනුම ගුරුවරුන් සමඟ බෙදා හදා ගැනීමට ඔවුනට පුළුවන. එමෙන් ම ඔවුන්ගේ උපදේශාත්මක හවුල්කාරත්වය හරහා ගුරුවරුන්ගේ පාඩම් සඳහා වඩාත් ඵලදායී ලෙස සමෝධානය කළ හැකි මෙම මෙවලම් සහ වේදිකාවන් වෙතට ගුරුවරුන් මෙහෙයවීමට ද ඔවුනට හැකියාව ඇත. ප්‍රාන්තීය සහ ජාතික ඉගැන්වීම් ප්‍රමිති සහ මාර්ග දර්ශක සමඟ සමපාත වීමට පාඩම් සැලසුම් කිරීමටත්, ඉගැන්වීම් ක්‍රම විද්‍යාත්මක උපායමාර්ග භාවිතයෙන් පාඩම් ක්‍රියාත්මක කිරීමටත් අනාගත භාවිතයන් සඳහා වර්ධනයන් හඳුනා ගැනීමට පාඩම් පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණයන් ඇතුළත් ඉගෙනුම් ඵල විශ්ලේෂණය කිරීමටත් ගුරුවරුන් සමඟ සහයෝගීත්වයෙන් කටයුතු කිරීමට කාලය අවශ්‍ය වේ.

එමෙන් ම කාලය සැලසුම් කළ යුත්තේ ගුරුවරුන්ට ඵලදායී වෘත්තීය සංවර්ධනයක් ද සැපයීමටය. පර්යේෂණ කිරීමටත් නවෝත්පාදන තාක්ෂණයන් හැඩ ගැන්වීමටත් ඉගැන්වීම සහ ඉගෙනුම වෙතට ඒවා සමෝධානය කිරීමට ඉගැන්වීම් ක්‍රම විද්‍යාත්මක උපායමාර්ග සංවර්ධනය කිරීමටත් පූර්වසේවා පාසල් පුස්තකාලයාධිපතීන්ට කාලය අවශ්‍ය වේ. ඉගැන්වීමේ දී සහ ඉගෙනුමේ දී භාවිත කළ හැකි සාධිකාරී සම්පත් සොයා ගැනීමට සහ ඇගයීමට ඔවුනට කාලය අවශ්‍යය. එමෙන් ම උපදෙස් දීමට පෙර, උපදෙස් දෙන අතරතුර සහ උපදෙස් දීමෙන් පසු ගුරුවරුන්ගේ ක්ෂණික අවශ්‍යතා සපුරාලීමට පුරුදු කිරීම සහ උපදේශකත්වය සඳහා කාලය කැප කළ යුතුය.

ගුරුවරුන් වෙනස් විශ්වාසයන් ගෙන එන අතර උපදේශාත්මක හවුල්කාරත්වයකට ඇති කැමැත්තේ මෙන්ම බියෙහි විවිධ මට්ටම් පෙන්වයි. එහෙයින් ගුරුවරුන් සමඟ විශ්වසනීය සබඳතාවක් ගොඩනැංවීමට කාලය කැප කිරීම අවශ්‍ය වේ. Martin ට අනුව ''මිනිස් සබඳතා සංවර්ධනය කිරීමේ දී සහ හවුල්කරුවන් වෙතට අවධානය යොමු කිරීමේ දී කාලය ආයෝජනය කිරීම තීරණාත්මක වේ.'' (2013, පි. 19) පූර්වසේවා පාසල් පුස්තකාලයාධිපතීන් පාසල් ප්‍රජාවේ මෙකී අවශ්‍යතා සපුරාලීමට උපායමාර්ගික ලෙසත් ඵලදායී ලෙසත් කාලය වෙන් කිරීමේ සහ ඊට ප්‍රමුඛතාව ලබා දීමේ ආකාරය වටහා ගැනීම අවශ්‍යය.

## ඉලක්ක

ඉලක්ක නිර්මාණය පාසල් පුස්තකාලයාධිපතීන්ගේ සහ පාසල් පුස්තකාල වැඩසටහනෙහි නායකත්වය යටතට දැමිය හැකි බොහෝ වෙනත් අයිතමවල වටයක් සම්පූර්ණ කරයි. ඉගෙනුම සඳහා ඉගැන්වීම, සාක්ෂරතාව හා කියවීම, තොරතුරු හා දැනුම, උපදේශනය හා නායකත්වය සහ වැඩසටහන් කළමනාකරණය හා පරිපාලනය මේවාට නිදසුන් වේ. පූර්වසේවා පාසල් පුස්තකාලයාධිපතීන් ඔවුන්ගේ ව්‍යවහාරයේ දී ඉලක්ක කිරීමට අවශ්‍ය වන මෙම නියත ක්ෂේත්‍රවල දැනුමින් සන්නද්ධ විය යුතුය. වෘද්ධිය සහ සංවර්ධනය, විවිධත්වයෙන් යුත් ඉගෙනුම් ශෛලීන්, සංස්කෘතික පසුබිම්, ශිෂ්‍ය සහ ගුරු හැකියාවන්, අවශ්‍යතා සහ රුචිකත්වයන්, ඉගැන්වීම සහ ඉගෙනුම සඳහා විශිෂ්ට ව්‍යවහාර යනාදියට සම්බන්ධ ඉගෙනුම්කරුවන් හා ඉගෙනුම පිළිබඳ ස්වකීය දැනුම හරහා ඉගැන්වීම සහ ඉගෙනුම පිළිබඳ දැනුමක් විදහා පෑමට පූර්වසේවා පාසල් පුස්තකාලයාධිපතීන්ට හැකියාව පැවතිය යුතුය. එමෙන්ම ඔවුන්ට ශිෂ්‍ය සාධනය වෙත ඔවුන්ගේ බලපෑම සන්නිවේදනය කිරීමට ද හැකියාව තිබිය යුතුය.

සාක්ෂරතාව සහ කියවීම පාසල් පුස්තකාල වැඩසටහනට සහ කියවීමට ඉගෙන ගන්නා දරුවන්ට මූලික වේ. පූර්වසේවා පාසල් පුස්තකාලයාධිපතීන් සියලු ශ්‍රේණි මට්ටම්වල ගුරුවරුන් සහ සිසුන්ගේ තොරතුරු සහ පෞද්ගලික කියවීම් අවශ්‍යතා මෙන් ම රුචිකත්වයන් ද සපුරාලීමට විවිධත්වයෙන් යුත් පුළුල් සාහිත්‍ය පරාසයක් පිළිබඳ දැනුමක් විදහා දැක්විය යුතුය. කියවීම ප්‍රවර්ධනය සඳහා ඵලදායී වැඩසටහන්, ක්‍රියාකාරකම් සහ උපදේශාත්මක උපායමාර්ග ක්‍රියාත්මක කරන ආකාරය ගැන දැනුමක් ඔවුන්ට පැවතිය යුතුය. ඔවුන් ස්වකීය ප්‍රජාවෙහි සිටින සිසුන්ට සහ ගුරුවරුන්ට නිශ්චිත වන අවශ්‍යතා සපුරාලන මුද්‍රිත හා ඩිජිටල් සම්පත් එකතුවක් සංවර්ධනය කළ යුතුය. එමෙන් ම තමන් ප්‍රවේශ වී කියවා ඇති තොරතුරු අවබෝධ කර ගෙන එයින් නව අරුතක් නිර්මාණය කිරීමට සිසුනට හැකියාව ලබාදෙන උපදේශාත්මක උපායමාර්ග ගුරුවරුන් සමඟ සහයෝගයෙන් සංවර්ධනය කිරීම අවශ්‍යය.

ශිෂ්‍යයන්ට, ගුරුවරුන්ට සහ පරිපාලකයන්ට තොරතුරු වෙත සමාන ප්‍රවේශය සහතික කරන සහ ඔවුන්ගේ අවශ්‍යතාවලට සහාය වන විවිධ සම්පත් හා සේවා සෙවීම, ඇගයීම සහ භාවිතයට සහාය විය හැකි ආකාර විදහා දැක්වීමට පූර්වසේවා පාසල් පුස්තකාලයාධිපතීන්ට හැකි විය යුතුය. තොරතුරුවල පාරිභෝගිකයන් සහ නිෂ්පාදකයන්ට සහාය වන අදාළ ඉගෙනුම් අත්දැකීම් සැලසුම් කිරීමේ සහ සිසුන් ඒවාට සම්බන්ධ කිරීමේ හැකියාව ද ඔවුන්ට තිබිය යුතුය. තව ද, ඔවුනට පර්යේෂණ පැවැත්වීමේ හැකියාව පැවතීම ද අවශ්‍යය. එහි දී පාසල් පුස්තකාල වැඩසටහන වර්ධනය කිරීමටත් එහි ව්‍යවහාර

දැනුවත් කිරීමටත් නව දැනුම බෙදා හැරීමට දත්ත එක්රැස් කර, විශ්ලේෂණය කර භාවිත කිරීමට දැන ගත යුතුය.

උද්දේශනය සහ නායකත්වය යනු පාසල් පුස්තකාල වෘත්තීයවේදීන්ගේ තීරණාත්මක අවධානයකි. නායකත්වය මෙන් ම ව්‍යවහාරයෙන් තම පාසල් පුස්තකාල වැඩසටහනෙහි ඵලදායිත්වය විදහා දැක්වීමට පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන්ට හැකි විය යුතුය. පාසල් පුස්තකාල වැඩසටහන්, සම්පත් හා සේවා වෙත මෙහෙයවීමේ දී සහ උද්දේශනයේ දී සහාය වීමට පුස්තකාල ප්‍රජාවෙහි සියලු මට්ටම්වල පුද්ගලයන් සමඟ ඔවුන් සම්බන්ධ වීමටත් ජාලගත වීමටත් අවශ්‍යය. ඔවුන් ස්වකීය ඉගෙනුමට සහාය වන සාහිත්‍ය සහ ඩිජිටල් සම්පත් සමඟ එක පෙළට සිටිය යුතු අතර පුස්තකාල සංගම් සහ වෘත්තීයවේදී සම්මන්ත්‍රණ හරහා වෘත්තීය සංවර්ධන අවස්ථාවල ප්‍රයෝජනය ලබා ගැනීම ඒවාට දායක වීම කළ යුතුය.

පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් සිය පාසල් පුස්තකාල වැඩසටහනෙහි ඵලදායී කළමනාකරුවකු සහ පරිපාලකයකු වීමට ඇති තමන්ගේ හැකියාව විදහා දැක්වීම අවශ්‍යය. ඔවුන් පාසල් පුස්තකාල වැඩසටහන සමඟ පෙළ ගැසීමටත් ඒ සියල්ල පාසලේ මෙහෙවර, ආචාරධාර්මික මූලධර්ම සහ වෘත්තීය ප්‍රමිති සමඟ මුළුමනින්ම සම්බන්ධ කිරීමත් වැදගත්ය. විෂයමාලාව සංවර්ධනය කරන සහ පාසල් ප්‍රජාවේ අවශ්‍යතා සපුරාලන ගුණාත්මක එකතුවක් ගොඩ නැංවීම සඳහා සම්පත් ඇගයීමට සහ තෝරා ගැනීමට ඔවුනට හැකි විය යුතුය. එමෙන්ම ඔවුන්ට පාසල් පුස්තකාලයේ පහසුකම්, අයවැය සහ පුද්ගලයන් ඇගයීමට හැකියාව තිබීම අවශ්‍යය.

**විශ්වාසය**

පාසල් පසුබිමක දී පරිවර්තනය සඳහා විශ්වාසය ගොඩ නැංවීම තීරණාත්මක වේ. ඉදිරියට ගමන් කිරීමේ ක්‍රියාවලියට විශ්වාසය අත්‍යවශ්‍ය වන බවත් පාසල පුරා එය පවත්වා ගෙන යා යුතු බවත් Wink (2014) පවසයි. අඛණ්ඩ උපදේශාත්මක ක්‍රියාකාරකම් ගුරු සිසු සාර්ථකත්වයන්, හවුල්කාරත්වය වෙතට ඇති ආකල්ප සහ දෛනික පංති කාමර ක්‍රියාකාරකම් පුරා තාක්ෂණය සහ සම්පත්වල මෘදු සමෝධානය ශක්තිමත් කරන බව සියලු හවුල්කරුවන් විශ්වාස කළ යුතුය.

ගුරුවරුන් තමන්ගේ ඉගැන්වීම් වෙතට නව තාක්ෂණයන් සහ උපායමාර්ග සමෝධානය කිරීමට උත්සාහ කරන විට උපදේශාත්මක හවුල්කාරත්වයන් අවදානමක් නිර්මාණය කළ හැකිය. උපදේශාත්මක හවුල්කාරත්වයන්හි දී ගුරුවරුන් සුවපහසුවේ සහ දැනුමේ විවිධ මට්ටම්වල සිටිනු ඇත. බොහෝ ගුරුවරුන් තාක්ෂණය සාර්ථකව සමෝධානය කිරීමට බියක් දැක්විය හැකිය. මෙය ප්‍රමිත විභාගවල දී මනිනු ලබන ශිෂ්‍ය සාධනයට අවසානයේ දී බලපානු ඇත. අවදානමෙන් තොර හවුල්කාරත්වයක් තුළ පුස්තකාලයාධිපති තමන්ගේ කේවල අවශ්‍යතා සපුරාලනු ඇති බවට ගුරුවරුන් විශ්වාසයක් ගොඩ නංවා ගත යුතුය. මෙම අවදානමෙන් තොර පරිසරය ගොඩ නැංවීම උපදේශාත්මක හවුල්කාරත්වය වෙත ගුරුවරුන්ගේ විශ්වාසයේ මට්ටම් සහ ආකල්ප ශක්තිමත් කිරීමට උපකාරී වනු ඇත.

පාසල් පුස්තකාලයාධිපති සමස්ත පාසල් විෂයමාලා ප්‍රමිති සහ මාර්ග දර්ශක පිළිබඳ දැනුමක් සහිත අයෙකු බවත් සිසු ඉගෙනීමට බලපාන මෙවලම් සහ සාධිකාරී සම්පත් ඔවුනට සැපයීමේ දී

කුසලතා දක්වන බවත් ගුරුවරුන් විශ්වාසය කළ යුතුය. ඔවුන් පුස්තකාලයාධිපතීන් විශිෂ්ට ව්‍යවහාර නිරූපණය කරනු ඇති බවත් තාක්ෂණය සමෝධානය කරන පාඩම් සාමූහිකව සංවර්ධනය කිරීම, සාමූහිකව ඉගැන්වීම සහ සාමූහිකව ඇගයීම සඳහා ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ඇති බවත් විශ්වාස කිරීම අවශ්‍යය. අවසන් වශයෙන්, පාසල් පුස්තකාලයාධිපති, විදුහල්පති සමඟ සමීප සන්නිවේදනයක සිටින බවත් පාසලේ මෙහෙවරට සමපාත වන ක්‍රියාකාරකම්වල දී විදුහල්පති මඟ පෙන්වීම සපයන බවත් ඔවුන් තම හවුල්කාර අත්දැකීම් හසුරුවන විට අවශ්‍ය වන උපකාර හා සහායන් විදුහල්පති විසින් සපයනු ලබනු ඇති බවත් ගුරුවරුන් විශ්වාස කළ යුතුය. පුස්තකාලයාධිපති සෑම ගුරුවරයෙකුට ම සපයන මෙහෙයවීමේ සහ සහායේ ප්‍රමාණය, සෑම ගුරුවරයෙක්ගේ ම ආරම්භක සූදානම, විශ්වාසය, කුසලතාව යනාදිය සෑම ගුරුවරයෙකුගේ ම ප්‍රාරම්භක මට්ටමේ දැනුම මත රඳා පවතී. ඵලදායී හවුල්කාරත්වයන්හි සහභාගී වීමට ඇති ගුරුවරුන්ගේ වෙනස් සූදානම් තත්ත්වයන් නිසා පාසල් පුස්තකාලයාධිපතීන් ඔවුන් සමඟ සන්නිවේදනයට සූදානම් විය යුතුය. සෑම ගුරුවරයෙකුටම නිශ්චිත වන අවශ්‍යතා සපුරාලීම, පුස්තකාලයාධිපති සමඟ විශ්වාසදායී සබඳතාවක් ගොඩ නැංවීමට තමන්ට හැකි යැයි දැකීමට ගුරුවරයා සවිබල ගන්වයි. පුද්ගල පෞරුෂයන් සහ හැකියාවන්ට සම්බන්ධ තත්ත්වයන් සහ ගැටලු මෙන්ම නව වැඩසටහන් සහ දියුණු තාක්ෂණයන් හඳුන්වා දීම මගින් නිර්මාණය වූ තත්ත්වයන් හා ගැටලු හේතු කොට ගෙන නායකත්වය වෙත ඇති පාසල් පුස්තකාලයාධිපතීන්ගේ එළඹුම නිරන්තරයෙන් වෙනස් විය හැකිය. පූර්ව සේවා පුස්තකාලයාධිපතීන් විශ්වාසය ගොඩ නැංවීමට උපායමාර්ග ඉගෙන ගත යුතු අතර ඔවුන් සෑම ගුරුවරයෙකුගේ ම පුද්ගල අවශ්‍යතා මත පදනම්ව ගුරුවරුන් මෙහෙයවන ආකාරය ඉගෙන ගැනීම අවශ්‍යය. ඔවුන් ගුරුවරුන්ගේ කුසලතා සහ දැනුම් මට්ටම් මෙන්ම ඔවුන්ගේ කැමැත්තේ සහ විශ්වාසයේ මට්ටම්ද හඳුනා ගන්නා ආකාරය ඉගෙන ගත යුතුය. තාක්ෂණය භාවිතය සහ සමෝධානය කිරීමේ දී නව අභියෝගවලට මුහුණ දෙන විට ඔවුන්ගේ නියත සහ පුද්ගල අවශ්‍යතා සපුරාලීමට මෙවලම්, කුසලතා සහ දැනුම ගුරුවරුන්ට සැපයීම මගින් විශ්වාසය සහිත සබඳතාවක් ගොඩ නංවා ගැනීමට පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන්ට හැකි වනු ඇත. ගුරුවරුන්ගේ විශ්වාසය ලබා ගැනීමට ඇති හැකියාවෙන් පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් සන්නද්ධ කිරීම ගුරුවරුන්ගේ විශ්වාසය ගොඩ නැංවීමටත් නව තාක්ෂණයන් භාවිතයට පවත්නා ඔවුන්ගේ විශ්වාසය ශක්තිමත් කිරීමටත් උපකාරී වනු ඇත. ''කෙනෙකු තුළ ඇති විශ්වාසය ආත්ම විශ්වාසය ගොඩ නංවන අතර එහි ප්‍රතිඵලයක් ලෙස කණ්ඩායම් විශ්වාසය ද ගොඩ නංවයි. ජයග්‍රාහී කණ්ඩායමේ සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය පදනම් වන්නේ කණ්ඩායමේ වේ. සාමාජිකයන් තමන්ට මෙන්ම එකිනෙකාට දක්වන විශ්වාසයේ සහ ගෞරවයේ ප්‍රමාණය මත වේ. (Martin, 2013, පි. 45)

## විදුහල්පති නායකත්වය

පාසල් පුස්තකාලයාධිපතිගේ නායකත්ව සහ උපදේශාත්මක හවුල්කාර භූමිකාවන්ගේ තීරණාත්මක භූමිකාවක් විදුහල්පති නායකත්වය විසින් ඉටු කරනු ලබයි. පරිවර්තනීය නායකයන් වන විදුහල්පතිවරුන් පැහැදිලි සහ අවධාරණිත දැක්මක්, ආත්ම විශ්වාසයක්, සංවිධානයේ හොඳම රුචිකත්වයන් තුළ පවත්නා පැහැදිලි ලෙස ගණනය කරන ලද තීරණ සහිත පරිසරයක් නිර්මාණය කරයි. (Bass, 1985) ඔවුහු සහයෝගිතා හා හවුල්කාරත්වයන් වැලඳ ගන්නා පාසල් සංස්කෘතියක් සංවර්ධනය කරන අතර ඉගැන්වීම සහ ඉගෙනුම සඳහා ඇති නවෝත්පාදන තාක්ෂණයන් සහ උපාය මාර්ග

ශක්තිමත් කරති. ඔවුන්ගේ මෙහෙවර යොමුව ඇත්තේ සිසුන්ගේ අධ්‍යයන සාර්ථකත්වය සහ යහ පැවැත්ම වෙතය. (NPBEA, 2015) පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් විදුහල්පතිගේ නායකත්ව භූමිකාවේ අදාළත්වයත් විදුහල්පතිගේ සහාය ලැබීමෙහි ඇති වටිනාකමත් වටහා ගත යුතුය. එමෙන්ම ඔවුන් ඵලදායී නොවීමට සහ ඉදිරිගාමී සිතීමක් නොමැති වීමට ඉඩ ඇති විදුහල්පතිවරයෙකුගේ සහාය ලබා ගැනීම සඳහා ඇති උපායමාර්ග ඉගෙන ගැනීම ද අවශ්‍යය.

විදුහල්පතිවරුන් දැන ගත යුතු සහ කළ යුතු දෑ සඳහා වන ජාතික ප්‍රමිතිවලට අනුව ''සිසුන්, අධ්‍යාපනඥයන්, පවුල් හා ප්‍රජා හවුල්කරුවන් සහ පුරවැසියන් ඇතුළු පාසල් ප්‍රජාවේ සෑම සාමාජිකයෙක් ම අඛණ්ඩ ඉගෙනීමක නියැළිය යුතුය.'' (7 පි.) පාසල් ප්‍රජාවේ ඉගෙන ගන්නා සියලු  පසාමාජිකයන්ට උදව් කිරීමේ දී පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් තමන්ගේ තත්ත්වය අවබෝධ කර ගත යුතුය. එමෙන්ම පාසල් තුළ සහ පොදුවේ ප්‍රජාව තුළ සිටින්නවුන් සඳහා ඵලදායී වෘත්තීය සංවර්ධනයක් සැපයීමට ඉගෙන ගැනීම අවශ්‍යය. 'දරුවන්ට නිවසේ දී පාසලේ දී සහ ප්‍රජාවේ දී ඉගෙනීමට සහ සංවර්ධනය වීමට අවස්ථා ගණනාවක් අවශ්‍ය බව' එම වාර්තාව තවදුරටත් සඳහන් කරයි. (12 පි.) පාසල් වේලාවෙන් ඔබ්බට ඉගැන්වීම සහ ඉගෙනුම ව්‍යාප්ත කරන ක්‍රියාකාරකම්, උපාය මාර්ග සහ තාක්ෂණයන් පිළිබඳ දැනුමක් පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන්ට තිබිය යුතුය. මෙම වාර්තාව විදුහල්පතිවරුන් සමඟ නායකත්වය සහ වගවීම බෙදා හදා ගත හැකි ආකාර සඳහා ක්‍රියාමාර්ග ගැනීමට විශ්වවිද්‍යාලවලට කරනු ලබන ආමන්ත්‍රණයක් ද වේ. විශේෂයෙන් එය විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් සූදානම් කිරීමේ වැඩසටහන් යළි සැලසුම් කිරීමට කරනු ලබන ආමන්ත්‍රණයකි. පුරෝගාමී ඉගෙනුම් ප්‍රජා ප්‍රමිති මගින් මෙම වැඩසටහන්වලට මඟ පෙන්විය යුතුය. 21 සියවස තුළ සාර්ථකත්වය අත්කර ගැනීම වෙතට ළමයින් සූදානම් කිරීම සඳහා අවධානය යොමු කරන වැඩසටහන් විදුහල්පතිවරුන්ට සහ ගුරුවරුන්ට අවශ්‍ය වේ. (7 පි.) තාක්ෂණ මෙවලම් සහ ව්‍යවහාරයන් තේරීමේ දී, විශ්ලේෂණයේ දී, ඵලදායී භාවිතයේ දී සහ සමෝධානයේ දී පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් පුහුණු කිරීම සඳහා ඇති දැඩි අවශ්‍යතාව අවධාරණය කරයි.

මෙවලම් සහ පුහුණුව ලබා දීම සහතික කිරීමටත් පාසල් පුස්තකාලයාධිපති නායකත්වයට සහ උපදේශාත්මක හවුල්කාරත්වයට ඇති බාධක ඉවත් කිරීමටත් ඵලදායී නායකයෙකු ලෙස විදුහල්පතිට පුළුවන. පාසල් පුස්තකාලයාධිපතීන් සහ ගුරුවරුන් දිරිමත් කිරීමට සහ සවිබල ගැන්වීමට හැකි තත්ත්වයක විදුහල්පති සිටින බවත් පාසල් පුස්තකාලයාධිපති නායකත්වය සහ උපදේශාත්මක හවුල්කාරත්වය ක්‍රියාත්මක කිරීමට සහ පවත්වා ගෙන යාමට හැකියාව ලබා දීමට අවශ්‍ය දෑ සැපයීමට විදුහල්පතිට හැකි බවත් පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් අවබෝධ කර ගත යුතුය.

## සන්දර්භය

පාසල් පුස්තකාලයාධිපති උපාධිධාරීන් සූදානම් කිරීමේ වැඩසටහන් තාක්ෂණයට, සිසු ජනගහනයට සහ අසල්වැසි තත්ත්වයන්ට ප්‍රවේශ වීම හා බැඳුණු විවිධ හේතු නිසා විභව වශයෙන් පාසල තුළ ස්ථානගත කරනු ඇත. සන්දර්භයට සැලකිල්ල දැක්විය යුතු බව පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් වටහා ගැනීම අවශ්‍යය. උපදේශාත්මක හවුල්කාරත්වයන් මෙහෙයවන විට සහ එයට

සහභාගී වීමේ දී ඔවුන් උගන්වනු ලබන්නේ එය තුළය. සිසුන්ගේ සහ ගුරුවරුන්ගේ පසුබිම සහ ඉගෙනුම් අවශ්‍යතා, ගුරුවරුන්ගේ සහ සිසුන්ගේ තාක්ෂණික ඉගැන්වීම් ක්‍රම විද්‍යාත්මක අවශ්‍යතා සහ පාසල් ප්‍රජාවට ප්‍රවේශ විය හැකි පවත්නා තාක්ෂණයන් යනාදිය සැලකිල්ලට ගත යුතු ක්ෂේත්‍රවලට ඇතුළත් වේ.

ජනගහන විද්‍යාත්මක තොරතුරු භාවිත කළ හැකි ආකාරය වටහා ගැනීම අධ්‍යාපනික තාක්ෂණය, ගුරුවරුන්ගේ අවශ්‍යතා සහ ව්‍යවහාරයේ යෙදී සිටින විට සිසුන්ගේ ඉගෙනුම් අවශ්‍යතා සම්බන්ධයෙන් තීරණ ගැනීමට පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන්ට සහාය වේ. රජයේ ප්‍රාථමික සහ ද්විතීයික පාසල්වල සුදු ජාතික සිසුන්ගේ ප්‍රතිශතයට වඩා දැන් සුළු ජාතික සිසුන්ගේ ප්‍රක්ෂේපිත සිසුන්ගේ ප්‍රතිශතය ඉහළය. (NCEC, 2013) ශිෂ්‍ය ජනගහනයේ නිර්මිතිය දැන ගැනීම මගින් ඉගැන්වීමේ දී සිසුන් සම්බන්ධයෙන් වැඩසටහන් සැකසීම, අයවැය ප්‍රතිපාදන, ශිෂ්‍ය ජනගහනයට නිශ්චිත වන එකතු සංවර්ධනය සහ ඉගැන්වීම් ක්‍රම විද්‍යාත්මක උපායමාර්ග හා ක්‍රියාකාරකම් ගැන දැනුවත් කළ හැකිය.

නවෝත්පාදක තාක්ෂණයන් සමෝධානය කිරීමේ දී වඩාත් ඵලදායී ලෙස ශ්‍රේණි මට්ටම්වල අන්තර්ගතය ඉගැන්වීමට ගුරුවරුන්ට උදව් කිරීම සඳහා ඇත මෙවලම් සහ උපායමාර්ග (පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන්) ඉගෙන ගත යුතුය. ගුරුවරුන් සහ සිසුන් විෂයන් වෙතට ගෙන ආ හැකි කුසලතා, පරතරයන්, සහ පූර්ව සංකල්පයන් පිළිබඳ පුරුදු සිසුන්ට විෂය අන්තර්ගතය මනාව අවබෝධ කර ගැනීම සඳහා ඉගැන්වීම් උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට ගුරු/පුස්තකාලයාධිපති හවුල්කාරත්වය සහාය වනු ඇත. අන්තර්ගතය, ඉගැන්වීම් ක්‍රමවේද සහ තාක්ෂණය සමඟ අන්තර්ක්‍රියාකාරී විය හැකි විවිධ භෞතික, සමාජීය, මනෝවිද්‍යාත්මක සහ සංස්කෘතික ලක්ෂණ සහිත ඉගැන්වීම් ඉගෙනුම් සන්දර්භයක් තුළ මතුවන තාක්ෂණය සමඟ කරනු ලබන ඉගැන්වීම් විවිධ ආකාරයෙන් ඉගෙනුම් ඵලවලට බලපානු ඇති බව Kelley (2010) යෝජනා කර ඇත. පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් උපදේශාත්මක හවුල්කාරත්වයට ගුරුවරුන් සූදානම් වන මට්ටම් හඳුනා ගන්නා ආකාරය ඉගෙන ගත යුතුය. සමහර ගුරුවරුන් අන් අයට වඩා එය ඉක්මනින් ග්‍රහණය කර ගන්නා අතර සෑම ගුරුවරයෙකුගේ ම කේවල අවශ්‍යතා සපුරාලීමට තම නායකත්ව ශෛලිය ගළපා ගැනීමට පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන්ට හැකි විය යුතුය.

Pew පර්යේෂණ මධ්‍යස්ථානය ගුරුවරුන් 2500 කට ආසන්න ප්‍රමාණයක් ඇසුරින් එවන් තාක්ෂණය භාවිත කරන ආකාරය පිළිබඳ සමීක්ෂණයක් කර ඇත. ඒ අනුව සම්පත් සහිත පාසල් දිස්ත්‍රික්ක සහ සම්පත් හීන පාසල් දිස්ත්‍රික්ක දිස්ත්‍රික්ක අතර තාක්ෂණයේ භූමිකාවෙහි වෙනසක් දක්නට ලැබේ. දිළිඳු නාගරික සහ ග්‍රාමීය කලාපවල පාසල් මෙහිදී බෙහෙවින් පසුගාමී වේ. (Purcell. El. Al, 2013) උපදේශාත්මක හවුල්කාරත්වය තුළ ස්වකීය ඉගැන්වීම් උපායමාර්ග සහ මගපෙන්වීම් ගැන දැනුවත් කිරීමට, පාසල් ප්‍රජාවට ප්‍රවේශ විය හැකි තාක්ෂණ වර්ග සහ ප්‍රමාණයන් දැන ගැනීමට ඇති අවශ්‍යතාව පූර්වසේවා පුස්තකාලයාධිපතීන් වටහා ගත යුතුය.

## අනාගත පර්යේෂණ

ස්වකීය වැඩසටහන් විභාග කිරීමට සහ ඒවා පාසල් පුස්තකාලයාධිපතීත්වය වෙතට ගුරුවරුන් හැඩ ගන්වන ආකාරය පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණය සඳහා T6 මොඩලය ගවේෂණය කිරීමට පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපති අධ්‍යාපනඥයන්ට අනාගත පර්යේෂණ ඇරයුම් කර සිටී. මෙම නිර්මාණ එකිනෙකට බැඳී තිබුණ ද T6 මොඩලයේ ප්‍රබලත්වය වන්නේ එක් අවස්ථාවක දී එක් නිර්මාණයක් ක්‍රියාවට නැංවිය හැකි වීමය. එහෙයින් අවශ්‍යතා වෙන් කිරීමටත් පරිවර්තනය වීමේ හැකියාව වර්ධනය කිරීමටත් ශක්තිය ඊට ඇත. සූදානම් කිරීමේ වැඩසටහන් තුළ ඒවායේ ඵලදායිත්වය සඳහා කේවල සංරචක සහ අනෙකුත් සංරචක සමඟ ඒවායේ අන්තර් ක්‍රීඩාව අධ්‍යයනය කිරීම අවශ්‍යය. ව්‍යවහාරය සඳහා සිසුන් සූදානම් කිරීමට මොඩලයේ නිර්මාණ සහාය වන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඔවුන් ප්‍රායෝගික අත්දැකීම් ලබන අතරතුර ගුණාත්මක පර්යේෂණ සිදු කළ හැකිය. ක්‍රියාත්මක කරන ලද කුසලතා සහ උපායමාර්ග කවරේ ද යන්න විභාග කිරීමට උපාධිධරයෙක් ව්‍යවහාරය වෙතට යොමු කිරීම රුචිකර විය හැකිය. පෙර පාසලේ සිට 12 ශ්‍රේණිය දක්වා පාසල් පරිසරය තුළ ගුරුවරයා පරිවර්තනය කිරීමට සහ අධ්‍යාපනයෙන් පරිබාහිර ක්ෂේත්‍ර වෙත මෙම මොඩලය ව්‍යවහාර කිරීමට අවධානය යොමු කිරීම පිළිබඳ වැඩිදුර අධ්‍යයන කළ හැකිය.

## නිගමනය

T6 රාමුවේ දී පාසල් පුස්තකාලයාධිපති, විදුහල්පතිවරයා සමඟ කේන්ද්‍රීය නායකත්ව තත්ත්වයක ස්ථානගත කරයි. මෙම රාමුව තුළ ගුරුවරයාගේ සිට පාසල් පුස්තකාලයාධිපති නායකයා සහ උපදේශාත්මක හවුල්කරුවා දක්වා සාර්ථකව පරිවර්තනය වීමට අංග හයක් අවශ්‍ය වේ. ස්වකීය පාඨමාලාවල දී කේවල ගොඩනැංවීම් ආමන්ත්‍රණය කිරීම, ව්‍යවහාරයේ දී නායකත්වය සහ සහයෝගීතාවට ඇති බාධක ජය ගැනීමට අවශ්‍ය මෙවලම් සහ උපායමාර්ග පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් වෙත සැපයීමට සහාය වනු ඇත. අපගේ පාසල්වල නිරන්තරයෙන් වෙනස් වන අවශ්‍යතා සපුරාලීමට අධ්‍යාපනඥයන් පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් සූදානම් කරන ක්‍රමය විභාග කිරීමට ක්‍රියා කිරීම සඳහා ආමන්ත්‍රණයක් ලෙස මෙය කටයුතු කරයි. T6 මොඩලයේ නිර්මාණ සංගත ලෙස හඳුන්වා දීම මගින් පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන් පිළිබඳ අධ්‍යාපනඥයන්ට මෙම ආමන්ත්‍රණයට පිළිතුරු දිය හැකිය.

පාසල් පුස්තකාලයාධිපති සූදානම් කිරීමේ වැඩසටහන්වල වෙනස්වීම් සඳහා මෙම මොඩලය බලපෑ හැකිය. සූදානම් කිරීමේ වැඩසටහන්වල දී උපදෙස් විවිධ විය හැකි වුව ද ප්‍රමිති සහ මාර්ග දර්ශක ක්‍රියාත්මක කිරීම සඳහා රාමුවක් සැපයීමට පාසල් පුස්තකාලයාධිපති සූදානම් කිරීමේ සියලුම වැඩසටහන්වල දී T6 මොඩලය යොදා ගත හැකිය. තමන් නවොත්පාදනයේ පරිවර්තනීය නායකයන් බවට පත් වන විටත් සමස්ත පාසල් ප්‍රජාවට බලපාන වෙනස්වීම් කාරකයන් වන විටත් වත්මන් සහ අනාගත සංශෝධිත ප්‍රමිති සහ මාර්ග දර්ශක පිළිබඳ හැඟීමක් ඇති කර ගැනීමට පූර්ව සේවා සිසුන්ට

මෙම මොඩලය උපකාරී වීමට පුළුවන. නායකත්වයට ඇති බාධක ජය ගැනීමට සහ ව්‍යවහාරයේ දී ගතික හවුල්කාරත්වයක් සංවර්ධනය කිරීමට පූර්ව සේවා පාසල් පුස්තකාලයාධිපතීන්ට සහාය වීමට විභවය මෙම මොඩලයේ ක්‍රියාකාරිත්වයට ඇත. මෙම හවුල්කාරත්වයන් හරහා තාක්ෂණය ඵලදායීව සමෝධානය කරන ඉගෙනුම් අවස්ථා සැපයීමේ දී ගුරුවරුන්ට වඩාත් කුසලතාපූර්ණ බවට පත් විය හැකිය. එය අවසානයේ පෙර පාසල් සිට 12 ශ්‍රේණිය දක්වා සිසුන්ට ප්‍රතිලාභ අත් කර දෙනු ඇත. පරමාදර්ශී ලෙස T6 මොඩලය අනුව පෙළගැසුණු උපායමාර්ග සමඟ පවත්නා තම ප්‍රථම පුස්තකාල කාර්යයට අපගේ උපාධිධාරීන් ප්‍රවේශ වන විට අස්ථාවර සහක්‍රියාවක් හරහා පරිවර්තනීය නායකත්වය පාසල් පුරා හට ගනු ඇත. එය නවෝත්පාදනය සමඟ සමපාත වීමටත් වෙනස සඳහා කාරකයන් වීමටත් අන්‍යයන්ට හැකියාව ලබා දෙයි.

## පාවුලෝ කොයියෝ මතක සටහන්

## පොත් සහ පුස්තකාල ගැන

ඇත්තට ම මං පොත් ගොඩක අයිතිකාරයෙක් නෙමේ. මීට අවුරුදු කීපෙකට කලින් එක අදහසක් මගෙ ජීවිතයට සැහෙන්න බලපෑම් කරන්න ගත්තා. අඩු ම දේපළකින් ජීවිතයෙ වැඩිම ගුණාත්මක බවක් ලබා ගැනීම තමයි ඒ අදහස. ඒ හින්දා මං යම් යම් තේරීම් කළා. ඒකෙන් අදහස් වෙන්නෙ නෑ මං ශ්‍රමණ ජීවිතයක් ගත කරන්න තීරණය කළා කියලා. එහෙම නැතුව, ඔබට අයිති හුඟක් අතහැරලා දැමීම ඔබට මහා නිදහසක් ගෙන දෙනවා. මගෙ සමහර යාළුවො (පිරිමි වගේම ගැහැනු) චෝදනා කරනවා ඒ අය තමන් අඳින දේ තෝරා ගන්න උත්සාහ කරන්න ජීවිතේ පැය ගණන් නාස්ති කරනවා කියලා. මොකද, ඒ අයට මහ ගොඩක් ඇඳුම් තියෙන හින්දා. දැන් මං තනි කළු පාට ඇඳුම්වලට විතරක් මගෙ අල්මාරිය සීමා කරලයි තියෙන්නෙ. ඒ හින්දා මට තවදුරටත් ඒ ප්‍රශ්නෙ නෑ.

මොනව වුණත් මං මෙතන දී කතා කරන්නෙ පොත් ගැන මිසක් ඇඳුම් විලාසිතා ගැන නෙමේ. මං මගෙ මූලික කාරණේට ආපහු එන්නම්. මං මගෙ පුස්තකාලෙ පොත් ගණන හාරසීයක මට්ටමට සීමා කරන්න තීරණය කළා. මං එහෙම තියා ගත්ත සමහර පොත්වලට තියෙන්නෙ භාවමය වටිනාකමක්. තවත් සමහර පොත් මං එහෙම තියාගන්නෙ ඒවා මං හැම තිස්සෙම නැවත නැවත කියවන හින්දා. මං මේ තීරණේ ගත්තෙ හේතු කීපෙකට. තමන්ගෙ ජීවිත කාලය පුරා බොහොම අමාරුවෙන් එකතු කරපු පොත් තියෙන මේ පුස්තකාලෙ අයිති මනුස්සය මැරුණට පස්සෙ. ඒ මනුස්සයා කිසිම ගෞරවයක් දක්වන්නෙ නැතුව ඒවා එහෙම පිටින් ම ඔහේ විකුණලා දාන හැටි දැක්කම මට ඇති වුණු කනගාටුව ඒකට එක හේතුවක්. ඒ වගේම මේ පොත් සේරම ගෙදර තියා ගෙන ඉන්නෙ මොන එහෙකට ද? මං බොහොම උගත් කෙනෙක් කියලා මගෙ යාළුවන්ට ඔප්පු කරන්න ද? ගෙදර බිත්ති අලංකාර කරන්න ද? මං මිල දී ගන්න පොත් මගෙ ගෙදර තියෙනවට වඩා මහජන පුස්තකාලෙක තිබ්බහම මිනිස්සු කියවයි.

මට යමක් දැන ගන්න ඕනෙ වුණහම මේ පොත් මට අවශ්‍ය වුණා කියලා කියන්න මං පුරුදු වෙලා හිටියා. ඒත් දැන් මට යමක් දැන ගන්න ඕකෙ වුණහම මං මගෙ පරිගණකය ළඟට ගිහින් වචනයක්

නැතිනම් කීපයක් ටයිප් කරනවා. එතකොට මට දැන ගන්න ඕනෙ හැම දෙයක් ද තිරයෙ දිස් වෙනවා. මේ ග්‍රහලෝකෙ තියෙන ලොකුම පුස්තකාලය වෙත අන්තර්ජාලයට ස්තුති වෙන්න.

ඇත්තට ම මං තවමත් පොත් මිල දී ගන්නවා. ඒ පොත්වලට ඉලෙක්ට්‍රොනික් ආදේශක නැහැ. ඒත් මං ඒවා කියවලා ඉවර වුණහම තවදුරටත් තියා ගන්නෙ නෑ. මං ඒව කාට හරි දෙනවා. එහෙම නැත්නම් මහජන පුස්තකාලයට දෙනවා. මගෙ අරමුණ කැලෑ ආරක්ෂා කරන එකවත් ත්‍යාගශීලී වෙන එකක්වත් නෙමේ. මං නිකමට විශ්වාස කරනවා පොතකට තමන්ගෙ වෙච්ච තමනක් තියෙනවා කියලා. ඒ හින්දා පොත් රාක්කෙක හිර කරලා තියන්න ඕනෙ නෑ කියලා.

කර්තෘභාගයෙන් ජීවත්වෙන ලෝකයෙක් හැටියට ඒක මට ම අවාසි වෙන්න පුළුවන්. මොනව වුණත්, පොත් වැඩි වැඩියෙන් ගන්න තරමට මගෙ ආදායම වැඩි වෙනවා. ඒත් ඒක පාඨකයට අසාධාරණ වෙන්න පුළුවන්. විශේෂයෙන් පුස්තකාලවලට පොත්ගන්න රජයේ මුදල්වලින් සෑහෙන ප්‍රමාණයක් වැය කරන රටවල්, බරපතළ තේරීමක් කරන්න තියෙන ප්‍රධාන නිර්ණායක දෙක මත පැහැදිලිව පදනම් වෙන්නෙ නෑ. පොතක් කියවීමෙන් කෙනෙක් ගබන සතුටයි ලේඛනයේ ගුණාත්මක බවයි තමා ඒ නිර්ණායක.

පොත්වලට නිදහසේ සංචාරය කරන්න ඉඩ දෙන්න. එතකොට ඒවා තවත් අයගෙ අත්වලින් ස්පර්ශය ලබාවි. තවත් අයගෙ ඇස්වලින් විනෝදය ලබාවි. මං මේක ලියන කොට මට ජෝර්ජ් ලුවිස් බෝගස්ගෙ කවියක අපැහැදිලි මතකයක් දැනෙනවා. ඒ කවියෙන් කියන්නෙ ආයෙත් කවදාවත් විවෘත නොකරන පොත් ගැනයි.

දැන් මං කොහෙද ඉන්නෙ? ප්‍රංශයෙ පිරීනියානු කුඩා නගරයක අවන්හලක වායුසමනයෙ සුවය විඳිමින් වාඩි වෙලා ඉන්නෙ. මොකද එළියෙ රස්නෙ දරා ගන්න බැරි හින්දා. බෝගස්ගෙ සම්පූර්ණ කෘති එකතුව මගෙ ගෙදර තියනවා. මගෙ ගෙදර තියෙන්නෙ මං මේක ලියන තැන ඉඳලා කිලෝමීටර කීපයක් ඈතින්. ඔහු මං නිතර කියවන වගේම නැවත නැවත කියවන ලේඛකයන් කීපදෙනාගෙන් කෙනෙක්. ඒත් ඇයි මං මගෙ න්‍යාය පරීක්ෂාවට ලක් කරන්නෙ?

මං පාර පැනලා විනාඩි පහකින් අවේදගෙන යන්න පුළුවන් අවන්හලකට ගියා. ඒක පරිගණකවලින් පිරුණු සයිබර් අවන්හලක්. මං අයිතිකාරයට සුබ පතලා සීතල බනිජ වතුර බෝතලයක් ඇණවුම් කළා. ඊට පස්සෙ සෙවුම් යන්ත්‍රයට ගිහින් මට මතක වැකියක වචන කීපයක් කතුවරයාගෙ නමත් එක්ක ටයිප් කළා.විනාඩි දෙකක් යන්න කලින් මෙන්න කවිය මගේ ඇස් ඉදිරිපිට.

මා හට යළි කිසිදා මතකයට නංවා ගත

නොහැකි වර්ලෙයින්ගේ වැකියක් තිබේ.

මාගේ පියවර තවදුරටත් තැබිය නොහැකි

වීථියක් නුදුරින් තිබේ.

මගේ මුහුණ අවසන් වරට දුක ඇති

කැටපතක් තිබේ.

මා අවසන් වතාවට වසා දමන ලද

දොරක් තිබේ.

මගේ පුස්තකාලයේ ඇති පොත් අතර

(මට ඒවා දුන් දකිය හැකිය.)

මා කිසිදා යළි විවර නොකරනු ඇති

පොත් සමහරක් තිබේ.

මං සමහර අයට දුන්න පොත් ගැනත් මට මේ දේම හිතෙනවා. මං ආයෙත් කවදාවත් ඒවයෙ පිටු පෙරළන එකක් නෑ. මොකද අලුත් වගේ ම හුගක් රුචිකර පොත් නිරන්තරයෙන් ප්‍රකාශයට පත් වෙන හින්දා. මං කියවන්න කැමතියි. දුන් මට හිතෙනවා පුස්තකාල තියෙන එක මිනිස්සුන්ට කොච්චර අපූරු ද කියලා. සාමාන්‍යයෙන් කියනව නම්, පොතුත් එක්ක ළමයෙකුගෙ සම්බන්ධය මුලින් ම පැන නගින්නෙ ඒ පොත්වල තියෙන පින්තූරයි වචනයි ගැන කුතුහලයෙන්. පොතක් ගීත ගයන කොටත්, යාළුවො හුග දෙනෙකුගෙ අතින් අතට ගිය මගේ පොතක පිටු ගැලවුණු පිටපතක් අමාරුවෙන් එකලස් කර ගෙන කෙනෙක් මගේ ළඟට අරගෙන එනකොටත් ඒ වගේ ම අපූර්වත්වයක් මට දැනෙනවා. ඒකෙන් අදහස් වෙන්නෙ ලේඛකයා පොත ලියමින් හිටිය වෙලාවෙ එයාගෙ මනස ගමනේ යෙදුණා වගේ ම මේ පොතත් සංචාරය කරලා තියෙනවා කියන එකයි.

---

**මෙම ලිපිය ජාත්‍යන්තර පාසල් පුස්තකාලයාධිපතින්ගේ සංගමය** (International Association of School Librarianship - IASL) **වෙතින්, ගෙවීමක් නොකර අවසර ලබාගෙන පරිවර්තනය සිදු කරන ලදී. මෙහි අන්තර්ගතය තවදුරටත් භාවිතා කිරීමට අවශ්‍ය නම්, ඒ සඳහා ජාත්‍යන්තර පාසල් පුස්තකාලයාධිපතින්ගේ සංගමයෙන්** (International Association of School Librarianship - IASL) **අවසර ලබාගත යුතුය.**

## *References*


American Association of School Librarians (AASL). (2009). *Empowering learners: Guidelines for school library media programs*. Chicago, IL: American Library Association.

American Library Association (ALA) & American Association of School Librarians (AASL). (2010). *ALA/AASL standards for initial preparation of school librarians*. Retrieved from http://www.ala.org/aasl/sites/ala.org.aasl/files/content/aasleducation/schoollibrary/2010_standards_with_rubrics_and_statements_1-31-11.pdf

Angeli, C., & Valanides, N. (2009). Epistemological and methodological issues for the conceptualization, development, and assessment of ICT-TPCK: Advances in technological pedagogical content knowledge (TPCK). *Computers & Education, 52*(1), 154-168.

Arora, V. (2014). (2014, January 21). The 4 “T”s for transforming medical education. [Web log comment].

Message posted to http://almost.thedoctorschannel.com/the-4-ts-for-transforming-medicaleducation/

Bass, B. M. (1985). *Leadership and performance beyond expectations.* New York, NY: Free Press; Collier Macmillan.
Biancarosa, G., Bryk, A.S., & Dexter, E. (2010). Assessing the value-added effects of literacy collaborative professional development on student learning. *Elementary School Journal, 111*(1), 7–34.
Blank, R. K., de las Alas, N., & Smith, C. (2008). *Does teacher professional development have effects on teaching and learning? Analysis of evaluation findings from programs for mathematics and science teachers in 14 states*. Washington, DC: Council of Chief State School Officers. Retrieved from http://www.ccsso.org/Documents/2008/Does_Teacher_Professional_Development_2008.pdf
Burns, J. M. (1978). *Leadership*. New York, NY: Harper & Row.
Burns, J. M. (1998). Transactional and transforming leadership. In G.R. Hickman (Ed.), *Leading organizations* (pp. 133-134). Thousand Oaks, CA: Sage Publications.
Denham, C. R. (2006). The 3 Ts of leadership engagement: Truth, trust, and teamwork. *Journal of Patient Safety, 2*(3), 262-172.
Ertmer, P. (2005). Teacher pedagogical beliefs: The final frontier in our quest for technology integration? *Educational Technology Research and Development, 53*(4), 25-39.
Ertmer, P., & Ottenbreit-Leftwich, A. (2010). Teacher technology change: How knowledge, confidence, beliefs, and culture intersect. *Journal of Research on Technology in Education, 42*(3), 255-284. Retrieved from http://www.edci.purdue.edu/ertmer/docs/AERA09_Ertmer_Leftwich.pdf
Everhart, N., Mardis, M. A. & Johnston, M. 2011. National board certified school librarians' leadership in technology integration: Results of a national survey. *School Library Research, 14*, 1-20. Retrieved from http://www.ala.org/aasl/sites/ala.org.aasl/files/content/aaslpubsandjournals/slr/vol14/SLR_NationalBoardCertified_V14.pdf
Farmer, L. (2006). Degree of implementation of library media programs and student achievement. *Journal of Librarianship and Information Science, 38*, 21-32.
Harvey, C. (2011). The coach in the library. *Educational Leadership, 69*(2). Retrieved from http://www.ascd.org/publications/educational-leadership/oct11/vol69/num02/The-Coach-in-the-Library.aspx
Haycock, K. (2007). Collaboration: Critical success factors for student learning. *School Libraries Worldwide, 13*(1), 25-35.
Hew, K. F., & Brush, T. (2007). Integrating technology into K-12 teaching and learning: Current knowledge gaps and recommendations for future research. *Educational Technology Research & Development, 55*, 223-252.
Hosseini, Z., & Tee, M. Y. (2012). Conditions influencing development of teachers' knowledge for technology integration in teaching. *International Magazine on Advances in Computer Science and Telecommunications (IMACST), 3*(1), pp. 91-101. Retrieved from http://imacst.com/web_documents/1202009.pdf
Hughes-Hassell, S., & Hanson-Baldauf, D. (2008). Information and communication technology use by north carolina school library media specialists: Perceived competencies and barriers. *School Library Media Research, 11*. Retrieved from http://www.ala.org/aasl/sites/ala.org.aasl/files/content/aaslpubsandjournals/slr/vol11/SLMR_InformationCommunication_V11.pdf
Hunt, R. D., & Luetkehans, L. (2013). The insider: School librarians as part of a blended professional learning community for student teacher development in technology integration. *School Libraries Worldwide, 19*(1), 13-27.
Johnston, M. P. (2012). School librarians as technology integration leaders: Enablers and barriers to leadership enactment. *School Library Media Research, 15*(1). Retrieved from *by race/ethnicity and region: Selected years, fall 1995 through fall 2023.* Retrieved from http://nces.ed.gov/programs/digest/d13/ tables/dt13_203.50.asp
O'Hara, S., Pritchard, R., Huang, C., & Pella, S. (2013). The Teaching Using Technology Studio: Innovative professional development to meet the needs of English learners. *TESOL Journal, 4*(2), 274-294.
Persico, D., Pozzi, F., Anastopoulou, S., Conole, G., Craft, B., Dimitriadis, Y., Hernández-Leo, D., Kali, Y., Mor, Y., Pérez-Sanagustín, M., & Walmsley, H. (2013). Learning design Rashomon I - supporting the design of one lesson through different approaches. *Research In Learning Technology Supplement*

*2013, 21,* 20224. doi: 10.3402/rlt.v21i0.20224
Purcell, K., Heaps, A., Buchanan, J., & Friedrich, L. (2013). *How teachers are using technology at home and in their classrooms.* Retrieved from http://www.pewinternet.org/files/oldmedia/ Files/Reports/2013/PIP_TeachersandTechnologywithmethodology_PDF.pdf
Rawson, C. H., Anderson, J., & Hughes-Hassell, S. M. (2015). Preparing pre-service school librarians for science-focused collaboration with pre-service elementary teachers. *School Library Research, 18*. Retrieved from http://www.ala.org/aasl/slr/volume18/rawson-anderson-hughes-hassell
Roberts, C., & Atkins, H. (2015). Teacher transformation: The 4 Ts of becoming a digital educator. Paper presented at the Society for Information Technology & Teacher Education International Conference, Las Vegas, NV, March 2-6, 2015. Retrieved from http://www.learntechlib.org/d/150351
Rodney, M. J., Lance, K. C., & Hamilton-Pennell. C. (2002). *Make the connection: Quality school library media programs impact academic achievement in Iowa.* Bettendorf, IA: Mississippi Bend Area Education Agency. Iowa Area Education Agencies. Retrieved from http://www.iowaaeaonline.org/pages/uploaded_files/Make%20The%20Connection.pdf
Scholastic. (2008). *School libraries work!* (3rd ed.). Retrieved from http://www2.scholastic.com/content/collateral_resources/pdf/s/slw3_2008.pdf
Smith, E. G. (2006). *Student learning through Wisconsin school library media centers: Case study report.* Madison, WI: Wisconsin Department of Public Instruction. Retrieved from http://dpi.wi.gov/sites/default/files/imce/imt/pdf/finalcasestudy.pdf
Staples, A., Pugach, M. C., & Himes, D. (2005). Rethinking the technology integration challenge: Cases from three urban elementary schools. *Journal of Research on Technology in Education, 37*(3), 285-311.
Todd, R. J. (2005). *Report of the Delaware school library survey 2004.* Retrieved from: http://www2.lib.udel.edu/taskforce/study/titlepage.pdf
Todd, R. J., & Kuhlthau, C. C. (2003). *Student learning through Ohio school libraries: The Ohio research study*. Columbus, OH : Ohio Educational Library Media Association. Retrieved from http://www.oelma.org/OhioResearchStudy.htm
Wallace, M. R. (2009). Making sense of the links: Professional development, teacher practices, and student achievement. *Teachers College Record, 111*(2), 573-596.
Weimer, G., & Hall, T. (2006). Wikis, and podcasts, and blogs, Oh my! In *Proceedings from ASCUE 2006: Maximizing technology to enhance learning June 11-15, 2006, Myrtle Beach, SC* (pp.281-287). Myrtle Beach, SC: ASCUE. Retrieved from https://ascue.org/wp-content/uploads/2014/11/2006-final.pdf
Wink, J. (2014, March 21). 4Ts of a transformational school. [Web log comment]. Retrieved from http://leadlearner2012.blogspot.com/search/label/Leadership
Yoon, K. S., Duncan, T., Lee, S. W.-Y., Scarloss, B., & Shapley, K. (2007). *Reviewing the evidence on how teacher professional development affects student achievement* (Issues & Answers Report, REL 2007–No. 033). Washington, DC: U.S. Department of Education, Institute of Education Sciences, National Center for Education Evaluation and Regional Assistance, Regional Educational Laboratory

Southwest. Retrieved from http://ies.ed.gov/ncee/edlabs/regions/southwest/pdf/REL_2007033.pdf

### ***Author Note***

Sheila F. Baker is a faculty member at the University of Houston-Clear Lake. She teaches in the areas of literacy, educational technology, and administration in the School Library andInformation Science Program. Her research interests include technology integration, educational technologies, digital literacy, instructional partnerships, and school librarian leadership.